## පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය

# ඇගයීම් වාර්තාව
# 2021

## 02
## පාලි

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි.

# පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2021

# ඇගයීම් වාර්තාව

# (02) - පාලි

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

පෙරදී මූලික පිරිවෙන් අවසාන විභාගය ලෙස හැඳින්වූ මෙය 2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ අතර මෙම විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක හෝ අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවෙණාචාර්යවරු ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය 2021 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තා ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවෙණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා 5ක් යටතේ ගොනු කර ඇත.
පිරිවෙන් සාමාන්‍ය පෙළ පාලි විෂයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මකව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I පත්‍රයේ ව්‍යුහය, I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය, I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේ ද I ප්‍රශ්න පත්‍රයට අදාළ ව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයෙන් ම ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමනය හා යෝජනා ද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතර හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කරගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා එලදායී අදහස් හා යෝජනා අප වෙත යොමු කරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2024.07.31
පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබාදීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයන් පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කෑරගල පද්මාවතී, වීදාගම සිරි සනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස හැඳින් වූ මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගයේ දී අපේක්ෂයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් දෙකක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා, පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරීන්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා බිහි කරන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ඩී. ඩී. වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග) |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග) |
| විෂය සම්බන්ධීකරණය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග) |
| සංස්කරණය | : | පූජ්‍ය මාවතවැවේ රතනවංශ හිමි<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>උතුරු මැද පළාත<br><br>පූජ්‍ය මැටිබැඹියේ සුමනසාර හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>පිරිවෙන් අධ්‍යාපන අංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ලේඛක මණ්ඩලය | : | පූජ්‍ය මාවතවැවේ රතනවංශ හිමි<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>උතුරු මැද පළාත<br><br>පූජ්‍ය මැටිබැඹියේ සුමනසාර හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>පිරිවෙන් අධ්‍යාපන අංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| පරිගණක පිටපත සැකසුම | : | ඩී.ජී. චමේෂි වීරසිරි<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |
| පිටකවරය නිර්මාණය | : | ඒ. එල්. කේ. චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාරී |

# පටුන

| | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | i |
| පෙරවදන | ii |
| පටුන | iv |
| වගු නාමාවලිය හා ප්‍රස්තාර නාමාවලිය | v |
| **1.** පාලි විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු | |
| 1.1 පාලි විෂයය අධ්‍යයනයේ අරමුණු | 01 |
| 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු | 02 |
| I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය | |
| **2.** I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු | 05 |
| 2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය | 06 |
| 2.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න 1 සිට 40 දක්වා) | 07 |
| 2.3 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය | 16 |
| 2.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා | 21 |
| II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය | |
| **3.** II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු | 23 |
| 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය | 23 |
| 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 24 |
| 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 24 |
| 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය | 25 |
| 3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය | 26 |
| 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය, ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන | 43 |
| **4.** පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු | 44 |
| **5.** ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා | 45 |

## වගු නාමාවලිය


**පිටු අංකය**

| | | |
|---|---|---|
| වගුව 1.1 | විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව | 2 |
| වගුව 1.2 | අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය | 2 |
| වගුව 1.3 | පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව | 3 |
| වගුව 1.4 | ලකුණු ලබා ගෙන ඇති ආකාරය පන්ති ප්‍රාන්තර අනුව | 4 |
| වගුව 2.1 | I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය | 15 |
| වගුව 2.2 | I පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) | 17 |
| වගුව 2.3 | තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය | 18 |
| වගුව 2.4 | තේමා අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය, එහි පහසුතාව හා හා තේමාවට අදාළ ප්‍රශ්නවල සමස්ත පහසුතාව | 20 |


## ප්‍රස්තාර නාමාවලිය


**පිටු අංකය**

| | | |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1 | I පත්‍රයේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 16 |
| ප්‍රස්තාරය 2.2 | I පත්‍රයේ තේමා අනුව එක් එක් අයිතමයන්හි පහසුතා දර්ශකය | 19 |
| ප්‍රස්තාරය 2.3 | I පත්‍රය - තේමා අනුව පහසුතාව හා ඉදිරිපත් වී ඇති ප්‍රශ්න ප්‍රතිශතය | 20 |
| ප්‍රස්තාරය 3.1 | II පත්‍රය - ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 24 |
| ප්‍රස්තාරය 3.2 | II පත්‍රය - ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 24 |
| ප්‍රස්තාරය 3.3 | II පත්‍රය - එක් එක් ප්‍රශ්නයේ කොටස්වල/අනුකොටස්වල පහසුතා දර්ශකය | 25 |
| ප්‍රස්තාරය 3.4 (a) | 1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 28 |
| ප්‍රස්තාරය 3.4 (b) | 1 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 28 |
| ප්‍රස්තාරය 3.5 (a) | 2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 30 |
| ප්‍රස්තාරය 3.5 (b) | 2 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 30 |
| ප්‍රස්තාරය 3.6 (a) | 3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 32 |
| ප්‍රස්තාරය 3.6 (b) | 3 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 32 |
| ප්‍රස්තාරය 3.7 (a) | 4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 34 |
| ප්‍රස්තාරය 3.7 (b) | 4 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 34 |
| ප්‍රස්තාරය 3.8 (a) | 5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 36 |
| ප්‍රස්තාරය 3.8 (b) | 5 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 36 |
| ප්‍රස්තාරය 3.9 (a) | 6 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 38 |
| ප්‍රස්තාරය 3.9 (b) | 6 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 38 |
| ප්‍රස්තාරය 3.10 (a) | 7 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 40 |
| ප්‍රස්තාරය 3.10 (b) | 7 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 40 |
| ප්‍රස්තාරය 3.11 (a) | 8 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 42 |
| ප්‍රස්තාරය 3.11 (b) | 8 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 42 |
| ප්‍රස්තාරය 3.12 | එක් එක් ප්‍රශ්නයේ පහසුතාව හා අපේක්ෂකයන් ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 43 |

# 1 පාලි විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1 පාලි විෂයය අධ්‍යයනයේ අරමුණු

1. පාලි භාෂාව නිවැරදි ව උච්චාරණය කිරීමේ හා ලිවීමේ හැකියාව ඇති කිරීම
2. පාලි භාෂාවේ අක්ෂර වින්‍යාසය, විවිධ පද, විවිධ වාක්‍ය රටා හා රචනය හුරු කිරීම
3. පාලි ගද්‍ය පද්‍ය පාඨ මාතෘ භාෂාවටත් මාතෘ භාෂාවෙන් පාලි භාෂාවටත් පරිවර්තනය කිරීමේ හැකියාව ඇති කිරීම
4. පාලි සාහිත්‍යය පිළිබඳ අවබෝධයක් ලබා දීම හා එහි එන ජීවන දර්ශනය උපයෝගී කර ගනිමින් මනා පෞරුෂයකින් යුත් චරිතයක් බිහි කිරීම
5. ත්‍රිපිටකාගත හරධර්ම චරිතායනය කෙරෙන ආදර්ශවත් භික්ෂු පරපුරක් රටට දායාද කිරීම
6. පාලි භාෂාව පිළිබඳ දැනුම සිංහල භාෂා ඥානයේ ප්‍රවීණත්වය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් බව තහවුරු කිරීම
7. පාලි භාෂාව තමන්ගේ මෙන් ම ජාතියේ ද සිය රටේ ද උරුමයක් බව තහවුරු කිරීම
8. ත්‍රිපිටකය හැදෑරීම සඳහා පාලි භාෂාව මූලික අවශ්‍යතාවක් බව අවධාරණය කිරීම
9. ත්‍රිපිටකය හා අටුවා පරිශීලනය කරමින් ධර්මය නිවැරදි ව අර්ථකථනය කරන භික්ෂු පිරිසක් ශාසනයට දායාද කිරීම
10. ත්‍රිපිටක බුද්ධ වචනය නිවැරදි ව ග්‍රහණය කිරීම පිණිස ඇති ඒකායන මාර්ගය පාලි භාෂාව ඉගෙනීම බව පසක් කිරීම
11. බුද්ධ වචනය සුරක්ෂිතව ඉදිරියට පවත්වාගෙන යෑමට ප්‍රතිබල සම්පන්න උතුමන් පිරිසක් බිහි කිරීම
12. මහාවිහාරීය භික්ෂු සම්ප්‍රදාය විසින් සුරක්ෂිත කරන ලද විශිෂ්ට ඥාන සම්භාරය නොනසා ආරක්ෂා කිරීම
13. ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් පාලි භාෂාව භාවිත කිරීම සඳහා සිසුන් යොමු කිරීම
14. පාලි භාෂාව ඉගෙනීමෙන් බෞද්ධ දර්ශනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම පහසු වීම නිසා තමන්ටත් සිව්පසය සපයන දායක පිරිසටත් මෙලොව පරලොව සුහසිද්ධිය ළඟා කර ගත හැකි බව තහවුරු කිරීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### වගුව 1.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2254 | 20 | 2274 |
| ඉංග්‍රීසි | 16 | 00 | 16 |
| එකතුව | 2270 | 20 | 2290 |

### වගුව 1.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 157 | 6.92 | 1 | 5.00 | 158 | 6.90 |
| B | 215 | 9.47 | 0 | 0.00 | 215 | 9.39 |
| C | 605 | 26.65 | 2 | 10.00 | 607 | 26.51 |
| S | 854 | 37.62 | 12 | 60.00 | 866 | 37.82 |
| W | 439 | 19.34 | 5 | 25.00 | 444 | 19.39 |
| **එකතුව** | **2270** | **100.00** | **20** | **100.00** | **2290** | **100.00** |

## වගුව 1.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 153 | 9 | 5.88 | 19 | 12.42 | 30 | 19.61 | 64 | 41.83 | 122 | 79.74 | 31 | 20.26 |
| ගම්පහ | 190 | 9 | 4.74 | 9 | 4.74 | 47 | 24.74 | 79 | 41.58 | 144 | 75.79 | 46 | 24.21 |
| කළුතර | 169 | 22 | 13.02 | 21 | 12.43 | 39 | 23.08 | 64 | 37.87 | 146 | 86.39 | 23 | 13.61 |
| මහනුවර | 236 | 48 | 20.34 | 27 | 11.44 | 79 | 33.47 | 71 | 30.08 | 225 | 95.34 | 11 | 4.66 |
| මාතලේ | 83 | 0 | 0.00 | 8 | 9.64 | 27 | 32.53 | 37 | 44.58 | 72 | 86.75 | 11 | 13.25 |
| නුවරඑළිය | 34 | 3 | 8.82 | 8 | 23.53 | 18 | 52.94 | 5 | 14.71 | 34 | 100.00 | 0 | 0.00 |
| ගාල්ල | 167 | 9 | 5.39 | 10 | 5.99 | 27 | 16.17 | 71 | 42.51 | 117 | 70.06 | 50 | 29.94 |
| මාතර | 180 | 16 | 8.89 | 20 | 11.11 | 69 | 38.33 | 56 | 31.11 | 161 | 89.44 | 19 | 10.56 |
| හම්බන්තොට | 128 | 9 | 7.03 | 27 | 21.09 | 28 | 21.88 | 36 | 28.13 | 100 | 78.13 | 28 | 21.88 |
| වවුනියාව | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 1 | 100.00 | 0 | 0.00 |
| අම්පාර | 58 | 0 | 0.00 | 10 | 17.24 | 24 | 41.38 | 17 | 29.31 | 51 | 87.93 | 7 | 12.07 |
| ත්‍රිකුණාමලය | 13 | 1 | 7.69 | 0 | 0.00 | 11 | 84.62 | 1 | 7.69 | 13 | 100.00 | 0 | 0.00 |
| කුරුණෑගල | 212 | 12 | 5.66 | 7 | 3.30 | 44 | 20.75 | 92 | 43.40 | 155 | 73.11 | 57 | 26.89 |
| පුත්තලම | 51 | 2 | 3.92 | 1 | 1.96 | 1 | 1.96 | 24 | 47.06 | 28 | 54.90 | 23 | 45.10 |
| අනුරාධපුරය | 141 | 2 | 1.42 | 8 | 5.67 | 30 | 21.28 | 52 | 36.88 | 92 | 65.25 | 49 | 34.75 |
| පොළොන්නරුව | 56 | 4 | 7.14 | 8 | 14.29 | 20 | 35.71 | 14 | 25.00 | 46 | 82.14 | 10 | 17.86 |
| බදුල්ල | 113 | 1 | 0.88 | 7 | 6.19 | 25 | 22.12 | 58 | 51.33 | 91 | 80.53 | 22 | 19.47 |
| මොණරාගල | 70 | 0 | 0.00 | 4 | 5.71 | 17 | 24.29 | 35 | 50.00 | 56 | 80.00 | 14 | 20.00 |
| රත්නපුරය | 132 | 9 | 6.82 | 11 | 8.33 | 35 | 26.52 | 50 | 37.88 | 105 | 79.55 | 27 | 20.45 |
| කෑගල්ල | 103 | 2 | 1.94 | 10 | 9.71 | 36 | 34.95 | 39 | 37.86 | 87 | 84.47 | 16 | 15.53 |
| **සමස්ත ප්‍රතිඵලය** | **2,290** | **158** | **6.90** | **215** | **9.39** | **607** | **26.51** | **866** | **37.82** | **1,846** | **80.61** | **444** | **19.39** |

වගුව 1.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 6 | 0.26 | 2290 | 100.00 |
| 81 - 90 | 32 | 1.40 | 2284 | 99.74 |
| 71 - 80 | 104 | 4.54 | 2252 | 98.34 |
| 61 - 70 | 208 | 9.08 | 2148 | 93.80 |
| 51 - 60 | 343 | 14.98 | 1940 | 84.72 |
| 41 - 50 | 475 | 20.74 | 1597 | 69.74 |
| 31 - 40 | 453 | 19.78 | 1122 | 49.00 |
| 21 - 30 | 409 | 17.86 | 669 | 29.21 |
| 11 - 20 | 229 | 10.00 | 260 | 11.35 |
| 01 - 10 | 31 | 1.35 | 31 | 1.35 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- 31 - 40 පන්ති ප්‍රාන්තරය සැලකීමේදී,
මෙම විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2290 දෙනා අතුරෙන් 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 453කි. එය ප්‍රතිශතයක් වශයෙන් 19.78%කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 1122ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 49.00%කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

කාලය : පැය **01** යි.

වරණ **4** බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40**කි. එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ **4** අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තේරීම අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

එක් එක් ප්‍රශ්නයට ලකුණු **1** බැගින් මුළු ලකුණු **40**කි.

## 2.2 I ප්‍රශ්න පත්‍රය

සැලකිය යුතුයි :

- ※ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
- ※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ※ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- ※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**Note :**

- ※ Answer **all** questions. This paper carries **40** marks.
- ※ In each of the questions from **1** to **40**, select one of the alternatives (1), (2), (3), (4) which is **correct or most appropriate.**
- ※ **Mark a cross (x) on the number corresponding to your choice in the answer sheet provided.**
- ※ Read the instructions given on the back of the answer sheet and follow them also.

1. අකාරාදි පිළිවෙළට ගළපා ඇති වරණය තෝරන්න.
Choose the option of words that is lined up in alphabetical order.
(1) ඊදිසස්ස, භගවන්තං, සුඛුමවාලිකා, කප්පරුක්ඛා
īdisassa, bhagavantaṃ, sukhumavālikā, kapparukkhā
(2) කප්පරුක්ඛා, ඊදිසස්ස, භගවන්තං, සුඛුමවාලිකා
kapparukkhā, īdisassa, bhagavantaṃ, sukhumavālikā
(3) ඊදිසස්ස, කප්පරුක්ඛා, භගවන්තං, සුඛුමවාලිකා,
īdisassa, kapparukkhā, bhagavantaṃ, sukhumavālikā
(4) භගවන්තං, ඊදිසස්ස, සුඛුමවාලිකා, කප්පරුක්ඛා
bhagavantaṃ, īdisassa, sukhumavālikā, kapparukkhā

2. පාලි භාෂාවේ කණ්ඨජාක්ෂර සංඛ්‍යාව,
The number of gutturals (kaṇṭhajākṣara) in Pali is
(1) 07කි. 07 (2) 08කි. 08 (3) 09කි. 09 (4) 10කි. 10

3. 'ව' යනු,
The sound 'va' is a
(1) මූර්ධජාක්ෂරයකි. mūrdhaja (guttural).
(2) කණ්ඨෝෂ්ඨජාක්ෂරයකි. kaṇṭhoṣṭhaja (guttural + labial)
(3) කණ්ඨතාලුජාක්ෂරයකි. kaṇṭhatāluja (guttural + cerebral)
(4) දන්තොෂ්ඨජාක්ෂරයකි. dantoṣṭhaja (dental + labial)

4. 'ඔකාසෙ සත්තමී' යන බාලාවතාර සූත්‍රයට නිදසුන් කළ හැකි පාලි වාක්‍යය තෝරන්න.
Select the sentence that stands as an example for the Bālāvatāra sutra: 'okāse sattamī'.

(1) භූපාලො පීඨෙ නිසීදති.
Bhūpālo pīṭhe nisīdati.

(2) පුරිසො රුක්ඛං ඡින්දති
Puriso rukkhaṃ chindati.

(3) මනුස්සා චොරා භායන්ති.
Manussa corā bhāyanti.

(4) සාමි දාසෙන කම්මං කාරෙති.
Sāmi dāsena kammaṃ kāreti.

5. 'ස්වාගතං' යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නේ,
The correct disjoining of 'svāgataṃ' is

(1) ස්ව + ආගතං ය.
sva + āgataṃ.

(2) ස්වා + ආගතං ය.
svā + āgataṃ.

(3) සු + වාගතං ය.
su + vāgataṃ.

(4) සු + ආගතං ය.
su + āgataṃ.

6. 43 සහ 83 යන සංඛ්‍යා නිවැරදි ව පාලියෙන් ප්‍රකාශ කෙරෙන සංඛ්‍යා නාම ඇතුළත් වරණය තෝරන්න.
Select the option that states the numerals 43 and 83 in Pali correctly.

(1) තිචත්තාළීසති, ඡාසීති
ticattāḷīsati, chāsīti

(2) තිචත්තාළීසති, ත්‍යාසීති
ticattāḷīsati, tyāsīti

(3) චතුත්තිංසති, ත්‍යාසීති
catuttimsati, tyāsīti

(4) චතුත්තිංසති, ඡාසීති
catuttimsati, chāsīti

7. දිගු සමාස පද පමණක් ඇතුළත් වරණය වන්නේ මින් කුමක් ද?
Which is the option that contains words of *Digu-samāsa* only.

(1) විජිතමාරො, චතුප්පදා
vijitamāro, catuppadā

(2) ගුණධනං, මුනිසීහො
gunadhanaṃ, munisīho

(3) වනවාසො, දසසඤ්ඤා
vanavāso, dasasaññā

(4) තිදණ්ඩං, පුත්තසතානි
tidaṇḍaṃ, puttasatāni

8. ක්‍රියා විශේෂණ යෙදෙන විභක්ති ඇතුළත් වරණය තෝරන්න.
Select the option in which verbal qualifiers are employed.

(1) දුතියා සහ චතුත්ථී
Dutiyā and Catutthī

(2) දුතියා සහ තතියා
Dutiyā and Tatiyā

(3) චතුත්ථී සහ ඡට්ඨී
Catutthī and Chaṭṭhi

(4) තතියා සහ චතුත්ථී
Tatiyā and Catutthī

9. 'පඤ්ඤාරතනං' යන්නෙහි නිවැරදි විග්‍රහ වාක්‍යය වන්නේ,
The correct definition of the term 'paññāratanaṃ' is

(1) පඤ්ඤා එව රතනං යන්නයි.
paññā eva ratanaṃ.

(2) පඤ්ඤා විය රතනං යන්නයි.
paññā viya ratanaṃ.

(3) පඤ්ඤා ඉති රතනං යන්නයි.
paññā iti ratanaṃ.

(4) පඤ්ඤා සා රතනං යන්නයි.
paññā sā ratanaṃ.

10. පාලි භාෂාවේ ආඛ්‍යාත විභක්ති ගණන,
The number of verbal cases in Pali is

(1) 07කි Seven (2) 08කි. Eight (3) 09කි. Nine (4) 10කි. Ten

11. ධාතුවක් අගට ප්‍රත්‍යය එකතු කිරීමෙන් සාදා ගනු ලබන්නේ,
The words formed by adding a suffix to the end of a root are

(1) තද්ධිත පදයි.
secondary derivatives.

(2) ආඛ්‍යාත පදයි.
verbs.

(3) ආඛ්‍යාත හා කිතක පදයි.
verbs and primary derivatives.

(4) කිතක පදයි.
primary derivatives.

12. 'දක්ඛී' යනු,
The word 'dakkhī' is a

(1) සන්ධි පදයකි.
combination.

(2) සමාස පදයකි.
compound.

(3) කිතක පදයකි.
primary derivative.

(4) තද්ධිත පදයකි.
secondary derivative.

13. අර්ථයෙන් සමාන වන නිපාත යුගලය තෝරන්න.
Select the synonymous pair of indeclinable particls (nipāta).

(1) නිච්චං, ඛිප්පං
niccaṃ, khippaṃ

(2) සාධුකං, සහසා
sādhukaṃ, sahasā

(3) අභික්ඛණං, සතතං
abhikkhanaṃ, satataṃ

(4) සම්මා, නිබද්ධං
sammā, nibaddhaṃ

14. 'උපවායතු' යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ,
The correct meaning of the term 'upavāyatu' is

(1) පානය කරාවා යන්නයි.
may drink.

(2) හමාවා යන්නයි.
may blow.

(3) සමීපයට යේවා යන්නයි.
may approach.

(4) වසාවා යන්නයි.
may live.

15. ද්විකර්මක ධාතු යුගලය ඇතුළත් නො වන වරණය තෝරන්න.
Selct the option which doesn't contain a pair of roots of dual object.

(1) දුහ, පුච්ඡ
duha, puccha

(2) වච, නී
vaca, nī

(3) ඨා, සිච
thā, sica

(4) හර, රුධි
hara, rudhi

16. 'සො පාදෙන ඛඤ්ජො' යන්නෙහි කාරක ප්‍රයෝගය වන්නේ,
The *kāraka prayoga* of the phrase 'so pādena khañjo' is

(1) ක්‍රියාපවර්ගාර්ථයෙහි තතියායි.
kriyāpavagge Tatiyā.

(2) කාලාර්ථයෙහි තතියායි.
kālatthe Tatiyā.

(3) සහාදි යෝගයෙහි තතියායි.
sahādiyoge Tatiyā.

(4) අංගවිකාරාර්ථයෙහි තතියායි.
aṅgavikāratthe Tatiyā.

17. 'අහං රුක්ඛං ඡින්දාමි' යන්නෙහි කර්ම කාරක වාක්‍යය වන්නේ,

The passive voice sentence of 'Ahaṃ rukkhaṃ chindāmi' is

(1) මයා රුක්ඛො ඡින්දීයතෙ ය.
Mayā rukkho chindīyate.

(2) අහං රුක්ඛො ඡින්දීයතෙ ය.
Ahaṃ rukkho chindīyate.

(3) මයා රුක්ඛං ඡින්දාමි ය.
Mayā rukkhaṃ chindāmi.

(4) අහං රුක්ඛං ඡින්දීයතෙ ය.
Ahaṃ rukkhaṃ chindīyate.

18. 'දන්තො සො දමථාය ධම්මං දෙසෙති' යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ,

The correct meaning of the phrase 'danto so damathāya dhammaṃ deseti' is

(1) දමනය කරනු පිණිස උන්වහන්සේ ධර්මය දේශනා කරති යන්නයි.
He preaches the dhamma for taming.

(2) දමනය වූ උන්වහන්සේ විසින් දමනය වීම පිණිස ධර්මය දේශනා කරති යන්නයි.
He is being tamed himself, preaches the dhamma for taming.

(3) දමනය වූ උන්වහන්සේ විසින් දමනය වීම පිණිස ධර්මය දේශනා කරයි යන්නයි.
By him who is being tamed preaches the dhamma for taming.

(4) උන්වහන්සේ විසින් දමනය වීම පිණිස ධර්මය දේශනා කරනු ලැබේ යන්නයි.
Dhamma is preached by him for taming.

19. සමාස මගින් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

It is not a benefit of compounds.

(1) සිතීමට පහසු බවයි.
convenience in thinking

(2) ලිවීමට පහසු බවයි.
convenience in writing

(3) ව්‍යක්ත බවයි.
eloquence

(4) උච්චාරණයට පහසු බවයි.
convenience in utterance

20. 'වෙළෙන්දෝ පස්දෙනෙක් ගැල් දහයකින් බඩු ගෙනාහ.' යන අර්ථය දෙන නිවැරදි පාලි වාක්‍යය තෝරන්න

Select the correct Pali sentence that carries the mening of 'Ten merchants brought goods by ten carriages.

(1) දස වාණිජා දසසු සකටෙසු භණ්ඩානි ආහරිංසු.
Dasa vāṇijā dasasu sakaṭesu bhaṇḍāni āharimsu.

(2) දසා වාණිජා දසහි සකටෙහි භණ්ඩානි ආහරිංසු.
Dasā vāṇijā dasahi sakaṭehi bhaṇḍāni āharimsu.

(3) දසවාණිජා දසහි සකටෙහි භණ්ඩානි ආහරිංසු.
Dasa vānijā dasahi sakaṭehi bhaṇḍāni āharimsu.

(4) දසහි වාණිජෙහි දස සකටෙහි භණ්ඩානි ආහරිංසු.
Dasahi vānijehi dasa sakaṭehi bhaṇḍāni āharimsu.

21. 'යථාබලං' යනු,

The term 'yathābalaṃ' is a

(1) සමාස පදයකි.
compound.

(2) තද්ධිත පදයකි.
secondary derivative.

(3) කිතක පදයකි.
primary derivative.

(4) සන්ධි පදයකි.
combination.

22. 'මුත්ත' යනු,

The term 'mutta' is a

(1) අනාගත කිතකයකි.
primary derivative of future.

(2) අතීත කිතකයකි.
primary derivative of past.

(3) වර්තමාන කිතකයකි.
primary derivative of present.

(4) තෛකාලික කිතකයකි.
primary derivative of three times.

23. 'එකහමාර' යන තේරුම දෙන පාළි වචනය කුමක් ද?

The Pali word for 'one and half' is

(1) දියඩ්ඪ
diyaḍḍha.

(2) තියඩ්ඪ
tiyaḍḍha.

(3) අඩ්ඩුඩ්ඪ
aḍḍuḍḍha.

(4) අඩ්ඪෙක
aḍḍheka.

24. 'සචෙ සො පඨමවයෙ පබ්බජිස්සා අරහා අභවිස්සා' මෙම වාක්‍යයෙහි ක්‍රියාපදය අයත් වන්නේ,

The verb of the sentence 'sace so paṭhamavaye pabbajissā arahā abhavissā' belongs to the tense/ mood named

(1) හීයත්තනී ආඛ්‍යාතයට ය.
Hīyattanī.

(2) පරොක්ඛා ආඛ්‍යාතයට ය.
Parokkhā.

(3) භවිස්සන්ති ආඛ්‍යාතයට ය.
Bhavissanti.

(4) කාලාතිපත්ති ආඛ්‍යාතයට ය.
Kālātipatti.

25. "ඉදානි ...................... ධම්මං ච ...................... ච සංගායෙය්‍යාම" යන වාක්‍යයෙහි ක්‍රියාපදය අයත් වන්නේ,

Select the matching pair of words to the blanks of the sentence 'Idāni................. dhammaṃ ca .............. ca saṅgāyeyyāma'.

(1) මයං - සංඝං
mayaṃ – saṅghaṃ

(2) මයං -විනයං
mayaṃ – vinayaṃ

(3) මය්හං - විනයං
mayihaṃ – vinayaṃ

(4) ඛො - විනයං
kho – vinayaṃ

● පහත සඳහන් ගාථා ඇසුරෙන් **26** සිට **29** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

Answer the questions from No. **26** to **29** in the light of the following verses.

අහං සුගත මාතා තෙ - ත්වං ච වීර පිතා මම,
සද්ධම්මසුඛදො නාථ - තයා ජාතම්හි ගොතම.

Ahaṃ sugata mātā te - tvaṃ ca vīra pitā mama,
saddhammasukhado nātha - tayā jātamhi Gotama.

සංවඩ්ඪිතො'යං සුගත - රූපකායො මයා තව,
අනින්දියො ධම්මකායො - මම සංවඩ්ඪිතො තයා.

Samvaḍḍhito'yaṃ sugata - rūpakāyo mayā tava,
anindiyo dhammakāyo - mama sanvaḍḍhito tayā.

මුහුත්තසණ්හාසමනං - ඛීරං ත්වං පායිතො මයා,
තයා'හං සන්තමච්චන්තං - ධම්මඛීරං හි පායිතා.

Muhuttasaṇhāsamanaṃ - khīraṃ taṃ pāyito mayā,
tayā'haṃ santamaccantaṃ - dhammakhīraṃ hi pāyitā.

26. තථාගතයන් වහන්සේ විසින් සංවර්ධනය කරන ලද්දේ කුමක් ද?

What was constructed by the Tathāgata?

(1) රූපකාය
rūpakāya

(2) ධර්මකාය
dharmakāya

(3) ධර්මය
dharma

(4) ශාසනය
sāsana

27. 'ධම්මඛීරං' යනු,

'Dhammakhīraṃ' is a

(1) උපමාවකි. (2) ස්වභාවෝක්තියකි. (3) රූපකයකි. (4) දීපකයකි.

upamā svabhāvokti rūpaka dīpaka

28. 'අහං සුගත මාතා තෙ - ත්වං ච වීර පිතා මම' යන මෙහි නිවැරදි අර්ථය තෝරන්න.

Select the correct meaning of the phrase 'Ahaṃ sugata mātā te-tvaṃ ca vīra pitā mama'.

(1) මම ඔබගේ බුද්ධ මාතාවයි. ඔබ ද මගේ වීර පියා ය.
I am your Buddha-mother. You are my heroic father too.

(2) මම ඒ සුගත මව ය. ඔබ ද මගේ පිය වීරයා ය.
I am that Buddha mother. You are my beloved hero too.

(3) සුගතයන් වහන්ස, ඒ ඔබ මගේ මව ද පියා ද වේ.
Well-gone one, you are my mother as well as father.

(4) සුගතයන් වහන්ස, මම ඔබගේ මව වෙමි. වීරයන් වහන්ස, ඔබ ද මගේ පියා වේ.
Well-gone one, I am your mother. Great heroic one, you are my father too.

29. 'සන්තමච්චන්තං' මෙහි නිවැරදි විසන්ධිය ඇතුළත් වරණය තෝරන්න.

Select the option that disjoins the term 'santamaccantaṃ' correctly.

(1) සන්ත + මච්චන්තං
santa + maccantaṃ

(2) සන්ත + අමච්චන්තං
santa + amaccantaṃ

(3) සන්තං + අමච්චන්තං
santaṃ + amaccantaṃ

(4) සන්තං + අච්චන්තං
santaṃ + accantaṃ

30. පාලි මහාබොධිවංසයේ කතුවරයා වන්නේ,

The author of the Pali Mahābodhivamsa is venerable

(1) උපතිස්ස තෙරුන් ය.
Upatissa.

(2) වාචිස්සර තෙරුන් ය.
Vācissara.

(3) දාඨානාග තෙරුන් ය.
Dāṭhānāga.

(4) රාජගුරු ධර්මකීර්ති තෙරුන් ය.
Rājaguru Dharmakīrti.

31. මජ්ඣිමනිකායේ අටුවාව වන්නේ,

The commentary of the Majjhimanikaya is the

(1) පරමත්ථජෝතිකා ය.
Paramatthajotikā.

(2) පපඤ්චසූදනී ය.
Papañcasūdanī.

(3) මනොරථපූරණී ය.
Manorathapūraṇī.

(4) සුමංගලවිලාසිනී ය.
Sumaṅgalavilāsinī.

32. අතීතකාල කිතකයක් නො වන්නේ,

A word that is not a primary derivative of the past.

(1) ඛජ්ජ යන්න ය.
khajja

(2) භුත්ත යන්න ය.
bhutta

(3) මුත්ත යන්න ය.
mutta

(4) ඤාත යන්න ය.
ñāta

33. 'පුප්ඵානොචිනිතුං' යනු,
'pupphānocinituṃ' is a

(1) සමාසයකි.
compound.

(2) සන්ධියකි.
combination.

(3) තද්ධිතයකි.
secondary derivative.

(4) කිතකයකි.
primary derivative.

34. 'ගබ්භිනී' සූත්‍රය අයත් වන්නේ,
The discourse named 'Gabbhinīsutta' belongs to the

(1) බොධිවග්ගයට ය.
Bodhivagga.

(2) සොණදණ්ඩවග්ගයට ය.
Soṇadaṇḍavagga.

(3) මුචලින්දවග්ගයට ය.
Mucalindavagga.

(4) චූලවග්ගයට ය.
Cullavagga.

35. A - සමන්තපාසාදිකා
Samantapāsādikā

B - විසුද්ධිමග්ග
Visuddhimagga

C - අත්ථසාලිනී
Atthasālinī

D - ජාතකට්ඨකථා
Jātakaṭṭhakathā

E - පරමත්ථදීපනී
Paramatthadīpanī

ඉහත ඒවායින් බුද්ධඝොෂ හිමියන් විසින් රචනා කරන ලද පාලි අටුවා ග්‍රන්ථ වන්නේ,
From the above, venerable Buddhaghosa's Pali commentaries are

(1) A B C හා E ය.
A, B, C and E.

(2) A B C හා D ය.
A, B, C and D.

(3) A C D හා E ය.
A, C, D and E.

(4) B C D හා E ය.
B, C, D and E.

36. 'වම්මික' යන්නෙහි අර්ථය වන්නේ,
The meaning of the term 'vammika' is

(1) ධාර්මික යන්නයි.
righteous.

(2) කාන්තාව යන්නයි.
woman.

(3) හොඬවැල යන්නයි.
elephant trunk.

(4) තුඹස යන්නයි.
anthill.

37. නවංගසත්ථුසාසනයට ඇතුළත් නො වන්නේ,
A unit that is not a section of the 'navangasatthusāsana' is the

(1) උදාන
Udāna.

(2) ජාතක
Jātaka.

(3) විමානවත්ථු
Vimānavatthu.

(4) වෙදල්ල
Vedalla.

38. දිඹුලාගල කාශ්‍යප මාහිමියන් වැඩ සිටියේ,
Dimbulāgala Kassapa thera was a resident of the

(1) මහාවිහාරයේ ය.
Mahāvihāra.

(2) අභයගිරියේ ය.
Abhayagiri.

(3) දික්සඳ සෙනෙවියා පිරිවෙණේ ය.
Dīghasanda Senāpati Pirivena.

(4) දිඹුලාගල ආරණ්‍යයේ ය.
Dimbulāgala forest monastery.

39. රීස් ඩේවිඩ්ස් පඬිතුමා උපත ලද්දේ,
Panditha Rhys Davids was born in

(1) 1843 වර්ෂයේ දී ය.
1843

(2) 1834 වර්ෂයේ දී ය.
1834

(3) 1873 වර්ෂයේ දී ය.
1873

(4) 1877 වර්ෂයේ දී ය.
1877

40. 'ථෙරවාදී බෞද්ධාචාර්යයෝ' යන කෘතියෙහි කතුවරයා වන්නේ,
The author of the Theravādī Bauddhācāryayo is

(1) රීස් ඩේවිඩ්ස් පඬිතුමා ය.
Pandita Rhys Davids.

(2) දිඹුලාගල කාශ්‍යප මාහිමි ය.
Dimbulāgala Kassapa thera.

(3) පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි ය.
Polwatte Buddhadatta thera.

(4) සංඝරක්ඛිත මාහිමි ය.
Saṅgharakkhita thera.


* * *

### වගුව 2.1 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 3 | 21. | 1 |
| 02. | 2 | 22. | 2 |
| 03. | 4 | 23. | 1 |
| 04. | 1 | 24. | 4 |
| 05. | 4 | 25. | 2 |
| 06. | 2 | 26. | 2 |
| 07. | 4 | 27. | 3 |
| 08. | 2 | 28. | 4 |
| 09. | 1 | 29. | 4 |
| 10. | 2 | 30. | 1 |
| 11. | 3 | 31. | 2 |
| 12. | 4 | 32. | 1 |
| 13. | 3 | 33. | 2 |
| 14. | 2 | 34. | 3 |
| 15. | 3 | 35. | 2 |
| 16. | 4 | 36. | 4 |
| 17. | 1 | 37. | 3 |
| 18. | 2/3 | 38. | 4 |
| 19. | 1 | 39. | 1 |
| 20. | All | 40. | 3 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **01** බැගින් මුළු ලකුණු **40**කි.

## 2.3. I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය




ප්‍රස්තාරය 2.1 (**RD/16/05/MPF** පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර සපයා ඇති 20 ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.98කි. එනම් 20 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 98%ක් නිවැරදි පිළිතුර සපයා ඇත. ඒ අනුව ප්‍රශ්නයේ පහසුතාව 98%කි.

**වගුව 2.2  I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)**

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමුවන වරණය | දෙවන වරණය | තෙවන වරණය | සිවුවන වරණය | Missing |
| 1 | 3 | 1.35 | 6.45 | 89.81 | 2.25 | 0.15 |
| 2 | 2 | 17.09 | 73.01 | 4.35 | 4.95 | 0.60 |
| 3 | 4 | 6.60 | 8.70 | 9.15 | 74.81 | 0.75 |
| 4 | 1 | 53.97 | 11.54 | 12.29 | 21.59 | 0.60 |
| 5 | 4 | 54.42 | 9.90 | 3.30 | 32.08 | 0.30 |
| 6 | 2 | 16.34 | 52.77 | 13.79 | 16.49 | 0.60 |
| 7 | 4 | 9.75 | 11.39 | 20.09 | 58.47 | 0.30 |
| 8 | 2 | 21.89 | 37.18 | 22.34 | 18.14 | 0.45 |
| 9 | 1 | 53.97 | 18.44 | 19.94 | 6.90 | 0.75 |
| 10 | 2 | 12.74 | 57.57 | 26.69 | 2.40 | 0.60 |
| 11 | 3 | 29.24 | 41.53 | 17.24 | 11.54 | 0.45 |
| 12 | 4 | 7.35 | 14.99 | 36.28 | 41.08 | 0.30 |
| 13 | 3 | 36.58 | 19.04 | 30.43 | 13.64 | 0.30 |
| 14 | 2 | 13.04 | 29.24 | 46.48 | 10.94 | 0.30 |
| 15 | 3 | 21.59 | 18.74 | 31.03 | 27.89 | 0.75 |
| 16 | 4 | 30.58 | 17.84 | 14.39 | 37.03 | 0.15 |
| 17 | 1 | 56.07 | 18.59 | 14.24 | 10.49 | 0.60 |
| 18 | 2/3 | 34.48 | 12.29 | 42.73 | 9.90 | 0.60 |
| 19 | 1 | 77.36 | 4.35 | 12.74 | 4.80 | 0.75 |
| 20 | All | 26.24 | 17.39 | 37.48 | 17.24 | 1.65 |
| 21 | 1 | 49.18 | 14.24 | 6.00 | 29.69 | 0.90 |
| 22 | 2 | 8.85 | 48.13 | 23.99 | 17.84 | 1.20 |
| 23 | 1 | 13.79 | 9.30 | 24.89 | 51.57 | 0.45 |
| 24 | 4 | 15.59 | 24.29 | 30.58 | 29.24 | 0.30 |
| 25 | 2 | 17.54 | 48.58 | 20.09 | 13.64 | 0.15 |
| 26 | 2 | 21.74 | 58.92 | 13.49 | 5.70 | 0.15 |
| 27 | 3 | 61.02 | 13.04 | 20.09 | 5.40 | 0.45 |
| 28 | 4 | 21.89 | 20.39 | 9.00 | 48.28 | 0.45 |
| 29 | 4 | 12.74 | 30.28 | 22.94 | 34.03 | 0.00 |
| 30 | 1 | 19.79 | 25.34 | 31.33 | 23.24 | 0.30 |
| 31 | 2 | 19.04 | 53.37 | 11.39 | 15.74 | 0.45 |
| 32 | 1 | 24.44 | 17.09 | 23.69 | 34.48 | 0.30 |
| 33 | 2 | 18.74 | 35.08 | 21.44 | 23.99 | 0.75 |
| 34 | 3 | 32.53 | 10.04 | 41.83 | 14.99 | 0.60 |
| 35 | 2 | 38.83 | 38.08 | 15.29 | 7.50 | 0.30 |
| 36 | 4 | 19.34 | 10.04 | 21.74 | 47.98 | 0.90 |
| 37 | 3 | 6.15 | 6.00 | 69.27 | 18.29 | 0.30 |
| 38 | 4 | 9.45 | 3.30 | 8.55 | 78.41 | 0.30 |
| 39 | 1 | 54.72 | 20.54 | 13.64 | 10.19 | 0.90 |
| 40 | 3 | 47.38 | 8.10 | 34.18 | 8.85 | 1.50 |

**එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.**
**'Missing' තීරයේ දක්වා ඇත්තේ කිසිඳු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරා ගත් හෝ අපේක්ෂකයන් ප්‍රතිශතයයි.**


## වගුව 2.3 තේමා අනුව I ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය

I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේදී පදනම් කරගත් තේමා තුනකි. ඒ ඒ තේමා අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය මෙසේය.

| තේමාව | ප්‍රශ්න අංකය |
|---|---|
| ව්‍යාකරණ | 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 15, 16, 17, 19, 21, 22, 24, 29, 32, 33 |
| සාහිත්‍යය | 25, 26, 27, 30, 31, 34, 35, 37, 38, 39, 40 |
| පරිවර්තන | 14, 18, 20, 23, 28, 36, |

ව්‍යාකරණ තේමාව යටතේ ඉදිරිපත් කර තිබූ ප්‍රශ්න 28 තවදුරටත් පහත ආකාරයට අනු තේමා අනුව විශ්ලේෂණය කර දැක්විය හැකිය.

| තේමාව | අනු තේමාව | ප්‍රශ්න අංකය |
|---|---|---|
| ව්‍යාකරණ | අක්ෂර | 1, 2, 3 |
| | ආඛ්‍යාත | 10, 11, 24 |
| | සංඛ්‍යා | 6 |
| | විභක්ති | 4, 8 |
| | තද්ධිත | 12 |
| | සමාස | 7, 9, 19, 21 |
| | කාරක | 15, 16, 17 |
| | නිපාත | 13 |
| | සන්ධි | 5, 29, 33 |
| | කිතක | 22, 32 |





ප්‍රස්තාරය 2.2 (**RD/16/05/MPF** පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදී.)

පරිවර්තන තේමාව යටතේ ඇති ප්‍රශ්න 06 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ 20 ප්‍රශ්නයයි. එය සමස්ත I පත්‍රයේම පහසුම ප්‍රශ්නය වේ. එහි පහසුතාව 0.98කි. මෙම ඉහළ ශිෂ්‍ය සාධනයට හේතුව 20 ප්‍රශ්නයේ වරණ හතර සඳහාම සියලුම විභාග අපේක්ෂකයන්ට ලකුණු හිමි වී තිබීමයි. පරිවර්තන තේමාව යටතේ පහසුතාව අඩු ම ප්‍රශ්නය 23 ප්‍රශ්නයයි. එහි පහසුතාව 30%කි. ඉහත පරිවර්තන තේමාව යටතේ ඇති ප්‍රශ්න හයෙහිම පහසුතාව 30%ක් හෝ ඊට වැඩි වේ. ව්‍යාකරණ තේමාව යටතේ ඇති ප්‍රශ්න 23 අතරින් පහසුතාව වැඩිම 17 ප්‍රශ්නයෙහි පහසුතාව 56%කි. පහසුතාව අඩුම 11 ප්‍රශ්නයෙහි පහසුතාව 14%කි. ව්‍යාකරණ ප්‍රශ්න 23න් පහසුතාව 50%ට වැඩි ප්‍රශ්න 2කි. ඒවා නම් 1 හා 17 ප්‍රශ්නයි. සාහිත්‍ය තේමාව යටතේ ප්‍රශ්න 11ක් ඉදිරිපත් කර ඇත. එම තේමාව යටතේ පහසුතාව වැඩිම 25 ප්‍රශ්නයෙහි පහසුතාව 48%කි. පහසුතාව අඩුම 27 ප්‍රශ්නයෙහි පහසුතාව 13%කි.

**වගුව 2.4 තේමා අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය, එහි පහසුතාව හා තේමාවට අදාළ ප්‍රශ්නවල සමස්ත පහසුතාව**

| තේමාව | පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව |
|---|---|---|
| ව්‍යාකරණ | 17 (56%) | 11 (14%) |
| සාහිත්‍ය | 25 (48%) | 27 (13%) |
| පරිවර්තන | 20 (98%) | 23 (30%) |




ප්‍රස්තාරය 2.3

## 2.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

2021 වර්ෂයේ පාලි විෂයය I පත්‍රය සැකසීමේ දී තේමා තුනක් යටතේ ප්‍රශ්න නිර්මාණය කර ඇති අතර ව්‍යාකරණ තේමාව යටතේ ප්‍රශ්න 23ක් ද, සාහිත්‍ය තේමාව යටතේ ප්‍රශ්න 11ක් ද පරිවර්තන තේමාව යටතේ ප්‍රශ්න 06ක් ද ඉදිරිපත් කර ඇත.

I පත්‍රයේ පහසුතාව වැඩිම 20 ප්‍රශ්නයෙහි පහසුතාව 98%කි. මෙම ප්‍රශ්නයෙහි වරණ 04ම නිවැරදි ලෙස තීරණය කර ලකුණු ලබා දී ඇති බැවින් ඉහළ ශිෂ්‍ය සාධනයට එය හේතු වී ඇත.

17 ප්‍රශ්නයේ පහසුතාව 56%කි. කතෘකාරක වාක්‍යයක කර්ම කාරක වාක්‍යය තේරීමට ඉදිරිපත් වී ඇති මෙම ප්‍රශ්නය සඳහා 56%ක අපේක්ෂකයන් පිරිසක් නිවැරදි වරණය තෝරා ඇත. කතෘ අනුක්ත කර්මය උක්තවන න්‍යාය පිළිබඳව අවබෝධය නිසා බහුතර අපේක්ෂක පිරිසක් නිවැරදි වරණය තෝරා ඇති බව උපකල්පනය කළ හැකිය.

I ප්‍රශ්න පත්‍රයෙහි පහසුතාව අඩුම 27 ප්‍රශ්නයෙහි පහසුතාව 13%කි. මෙම ප්‍රශ්නය සාහිත්‍ය තේමාව යටතේ ඉදිරිපත් කර ඇත. මෙහි දී ශිෂ්‍ය සාධනය අවම මට්ටමක පැවතීමට හේතු වන්නේ උපමා රූපක පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති වීම බව සිතිය හැකිය.

11 ප්‍රශ්නය හා 30, 40, ප්‍රශ්න සඳහා ද ශිෂ්‍ය සාධනය අඩු මට්ටමක පවතියි. 11 ප්‍රශ්නය ව්‍යාකරණ තේමාව යටතේ ඉදිරිපත්ව ඇති අතර ආඛ්‍යාත හා කිතක පිළිබඳ අවබෝධය නොමැති වීමෙන් ශිෂ්‍ය සාධනය අඩු වී ඇති බව සිතිය හැකි අතර 30 ප්‍රශ්නය සඳහා 4 ශ්‍රේණියේ වංශ කතා සාහිත්‍ය පිළිබඳ දැනුම අවම වීමත්, 40 ප්‍රශ්නය සඳහා අග්‍රගණ්‍ය පඬිවරුන් පිළිබඳ අවබෝධය අවම මට්ටමක පැවතීමක් අඩු ශිෂ්‍ය සාධනයට හේතු වී තිබිය හැකිය.

ප්‍රශ්න අංක 05, 11, 13, 14, 23, 24, 27, 30, 32, 35 හා 40 ප්‍රශ්න සඳහා අවධානය යොමු කිරීමේ දී නිවැරදි වරණයට සාපේක්ෂව වැරදි වරණයක් තෝරා ගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය ඉතා ඉහළ අගයකි.

11 ප්‍රශ්නයේ නිවැරදි වරණය 3 වරණය වන අතර එම වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය14%කි. නමුත් මෙහි දී නිවැරදි වරණය ලෙස 2 වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 41.53%කි. කිතක ආඛ්‍යාත පිළිබඳ සිසුන්ට අවබෝධයක් ලබාදීමට අවධානය යොමු කළ යුතු ය. ප්‍රශ්න අංක 23හි නිවැරදි වරණය වන පළමු වරණය තෝරා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 13.79%කි. මෙහි දී වැරදි වරණයක් වූ සිව්වන වරණය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 51.57%ක් තරම් වූ ඉහළ අගයකි. ''එකහමාර '' යන වචනයේ පාලි වචනාර්ථය පිළිබඳව අපේක්ෂකයන් තුළ නිවැරදි අවබෝධයක් නොතිබීමත් ''එකහමාර '' යන වචනාර්ථය සමඟ පාලි වචනාර්ථය ගැලපීමට යාමත් හේතුවෙන් මෙම වැරදි වරණය තෝරා ගැනීමට යොමු වී ඇති බව සිතිය හැකිය.

ඉහත සලකා බලන ලද නිදසුන්වලින් සමස්තයක් ලෙස සාහිත්‍ය තේමාව සඳහා මෙන්ම ව්‍යාකරණ තේමාව යටතේ ඇති ආඛ්‍යාත කොටස් සඳහා ගුරු සිසු අවධානය වැඩි වශයෙන් යොමු විය යුතු බව අවධාරණය කළ යුතු ය. ආඛ්‍යාත හා කිතක පිළිබඳව අවබෝධය නොමැති වීමෙන් බොහෝ ප්‍රශ්න සඳහා ශිෂ්‍ය සාධනය අවම මට්ටමක පවතියි. සතත අභ්‍යාසවල නියැලීම තුළින් ශිෂ්‍ය සාධනය සංවර්ධනය කර ගැනීමට කටයුතු කළ හැකිය. එමෙන්ම පාලි භාෂාවේ විෂය නිර්දේශයේ සමස්තය පිළිබඳව මනා අවබෝධය තුළින් එක් එක් විෂය කොටස් සුවිශේෂී ලෙස ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කිරීමට යොමු වීම ද ශිෂ්‍ය සාධනය සංවර්ධනය සඳහා වැදගත් වේ.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

II **පත්‍රය - කාලය : පැය 03යි.**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.

I කොටස - අනිවාර්යය ප්‍රශ්න දෙකකින් සමන්විත ය.

1 ප්‍රශ්නය : නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීම

2 ප්‍රශ්නය : (1) කොටස - වාක්‍ය කිහිපයක් පාලි භාෂාවට පරිවර්තනය කිරීම
(II) කොටස - පාලි භාෂා ඡේදයක් ආශ්‍රයෙන් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම

එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ලකුණු 24කි.

II කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න හයකින් සමන්විත ය. ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතු ය.


එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ලකුණු 36කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 24 + 36 = 60

**අවසාන ලකුණු ගණනය කිරීම :**

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 40 |
| II පත්‍රය | = | 60 |
| අවසාන ලකුණ | = | 100 |


## 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




II ප්‍රශ්න පත්‍රයේ පළමු හා දෙවන ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වන අතර එයින් පළමු ප්‍රශ්නය තෝරාගත් ප්‍රතිශතය 89.59%කි. දෙවන ප්‍රශ්නය තෝරාගත් ප්‍රතිශතය 81.51%කි. ප්‍රශ්න අංක 03 සිට 08 දක්වා ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 03ක් පමණක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු වූ අතර එයින් අපේක්ෂකයන් වැඩි පිරිසක් තෝරාගෙන ඇත්තේ 03, 07 හා 08 වන ප්‍රශ්න වේ. ඒවායේ ප්‍රතිශතයන් පිළිවෙළින් 67.1%, 68.82%, 40%ක් වේ. අඩුම අපේක්ෂකයන් සංඛ්‍යාවක් තෝරාගෙන ඇත්තේ පස්වන ප්‍රශ්නයයි. එය ප්‍රතිශතයක් ලෙස 20.43%කි.

ප්‍රස්තාරය 3.1 (RD/16/04/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

## 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :-

මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 12කි.

එම ලකුණුවලින්,


0-3 ප්‍රාන්තරයේ 47.99%ක් ද
4-6 ප්‍රාන්තරයේ 28.89%ක් ද
7-9 ප්‍රාන්තරයේ 15.58%ක් ද
10-12 ප්‍රාන්තරයේ 7.54%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

ප්‍රස්තාරය 3.2 (RD/16/02/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ඉදිරි පිටුවල අන්තර්ගත වේ.

## 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




**ප්‍රස්තාරය 3.3** (RD/16/04/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

අපේක්ෂකයන් වැඩිම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 2(ii)(අ) කොටසෙහි පහසුතා දර්ශකය 0.70කි. එනම් 2(ii)(අ) කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 70%ක් සාර්ථක ව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම කොටසෙහි පහසුතාව 70%කි. අපේක්ෂකයන්ගෙන් අවම සංඛ්‍යාවක් සාර්ථක ව පිළිතුරු සපයා ඇති 2(i)(ඉ) අනුකොටසෙහි පහසුතා දර්ශකය 0.08කි. එනම් 2(i) (ඉ) අනුකොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 8%ක් පමණක් සාර්ථක ව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම අනුකොටසෙහි පහසුතාව 8%කි.

## 3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය

### I කොටස

**01. ප්‍රශ්නය**

1. (i) **සිංහලට නගන්න.**

1. (i) සිංහලට නගන්න. *(ලකුණු 06)*

**අථ බො භගවා ආයස්මන්තං නන්දං බාහාය ගහෙත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ජෙතවනෙ අන්තරහිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි. තෙන ඛො පන සමයෙන පඤ්චමත්තානි අච්ඡරාසතානි සක්කස්ස දෙවානමින්දස්ස උපට්ඨානං ආගතානි හොන්ති කකුටපාදානි. අථ බො භගවා ආයස්මන්තං නන්දං ආමන්තෙසිඃ 'පස්සසි නො ත්වං නන්දඃ ඉමානි පඤ්ච අච්ඡරාසතානි කකුටපාදානී?'ති. 'එවං භන්තෙ'ති. 'තං කිං මඤ්ඤසි නන්ද, කතමා නු බො අභිරූපතරා ච දස්සනීයතරා ච පාසාදිකතරා ච, සාකියානී වා ජනපදකල්‍යාණී, ඉමානි වා පඤ්ච අච්ඡරාසතානි කකුටපාදානී?'ති. 'සෙය්‍යථාපි භන්තෙ පලුට්ඨමක්කටී කණ්ණනාසච්ඡින්නා.**

**(ලකුණු 06යි)**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්ද අතින් අල්ලාගෙන යම් සේ නම් බලවත් පුරුෂයෙක් හකුළන ලද හෝ බාහුව දිගු කරන්නේ ද දිගු කළා වූ හෝ බාහුව හකුළුවන්නේ ද එසේ ම දෙව්රම් වෙහෙරෙහි අතුරුදහන් වූයේ තව්තිසා දෙව්ලොව පහළ වූ සේක. එසමයෙහි වනාහි පරවියන්ට බඳු පා ඇති පන්සියයක් පමණ අප්සරාවෝ ශක්‍ර දේවේන්ද්‍රයාගේ උපස්ථානයට ආවාහු වෙති. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්ද තෙරුන් ඇමතූ සේක. නන්දය, ඔබ පරවියන්ට බඳු පා ඇති පන්සියයක් අප්සරාවන් දකින්නෙහි නො වේ ද යනුවෙනි. ස්වාමීනි, එසේ ය යනුවෙනි. නන්දය, ඒ ගැන කුමක් සිතහි ද? ශාක්‍යපුත්‍රී වූ ජනපද කල්‍යාණිය හෝ පරවියන්ට බඳු පා ඇති මේ අප්සරාවන් පන්සියය හෝ මොවුන් අතරින් කවරහු නම් වඩා රූමත් වූවෝ ද වඩා දැකුම්කලු වූවෝ ද වඩා ප්‍රසාදාවහ වූවෝ ද යනුවෙනි. ස්වාමීනි, කන් නාසා සිඳුණු පිළිස්සුණු වැඳිරි යම් සේ වන්නී ද.

නිවැරදි සිංහල පරිවර්තනය සඳහා ලකුණු හය (6) ම පිරිනමන ලදි.
ව්‍යාකරණ දෝෂ, අක්ෂර වින්‍යාස දෝෂ සඳහා එක ලකුණක් (1) අඩු කරන ලදි.
වචන මගහැර මනඃකල්පිත ව කර ඇති පරිවර්තනය සඳහා සුදුසු පරිදි ලකුණු ප්‍රදානය කිරීම සිදු කරන ලදි.

(ii) **සිංහලට නගන්න.**

**අහො'නුකම්පිකා අම්හං සබ්බාසං වීර ගොතමී,**
**වාසිතා තව පුඤ්ඤෙහි පත්තා නො ආසවක්ඛයං.**
**කිලෙසා ඣාපිතා අම්හං භවා සබ්බෙ සමූහතා,**
**නාගීව බන්ධනං ඡෙත්වා විහරාම අනාසවා.**
**ස්වාගතං වත නො ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,**
**තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.**

**(ලකුණු 06යි)**


**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

- වීරයන් වහන්ස, පුදුම යි, ගෝතමී තොමෝ අප සියල්ලන්ට ම අනුකම්පා ඇත්තී ය. ඔබ වහන්සේගේ කුශලයන් විසින් සුවඳවත් කරන ලද අප නිවණට පැමිණියෙමු.
- අප විසින් කෙලෙස්හු දල්වන ලදහ. සියලු භවයෝ මුලින් උපුටන ලදහ. බැඳුම් සිඳ හැසිරෙණ හස්ති රාජිනීන් සේ කෙලෙස් රහිත ව වාසය කරමු.
- ශ්‍රේෂ්ඨ බුදුන් වහන්සේ සමීපයේ අපට ඒකාන්තයෙන් යහපත් පැමිණීමක් විය. ත්‍රිවිද්‍යාව උපදවන ලදී. බුදුන්ගේ අනුශාසනාව කරන ලදී.

**එක් ගාථාවක් පරිවර්තනය සඳහා ලකුණු 2 බැගින් ගාථා තුනෙහි පරිවර්තනය සඳහා ලකුණු 6කි. පරිවර්තන දුර්වලතා සඳහා ලකුණු අඩු කිරීමේ දී 1 ඡේදයේ ක්‍රමය අනුගමනය කරන ලදි.**

## 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**





ප්‍රස්තාරය 3.4(a)

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එසේ වුවත් අංක 3.1 ප්‍රස්තාරය අනුව පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 85.59%ක් පමණ පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමි වේ. ඉන්

00 - 03 ප්‍රාන්තරයේ 48%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 29%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 15%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 8%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 8%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 77%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 6ක් හෝ ඊට අඩුවෙනි.

**ප්‍රශ්නයේ කොටස්වල පහසුතාව**




ප්‍රස්තාරය 3.4(b)

මෙම ප්‍රශ්නය නිර්දිෂ්ට පරිවර්තන කුසලතාව මනින ප්‍රශ්නයකි. පාලි භාෂාවෙන් දෙනු ලබන නිර්දිෂ්ට ගද්‍ය පාඨයක් හා ගාථා තුනක් මෙම ප්‍රශ්නයට ඇතුළත් වන අතර එක් කොටසකට ලකුණු 06 බැගින් හිමි වේ. අපේක්ෂකයන්ගෙන් පද ගතාර්ථ හෝ අන්වයානුකූල පරිවර්තනයක් සැපයීම බලාපොරොත්තු වී ඇත. මේ සඳහා නිර්දිෂ්ට කොටස්වල අර්ථ පාඩම් කර තිබීම අවශ්‍ය වේ. ඒ ඒ පරිවර්තනවලට ලකුණු පිරිනමා ඇති ආකාරය අනුව පහසුතාව පිළිවෙළින් 45%ක් හා 24%ක් වේ.

සමස්තයක් වශයෙන් ගත් කළ පරිවර්තනවලට ලකුණු ලබා ගැනීම සාර්ථක වුවත් ගාථා පරිවර්තනයට ලකුණු ලබා ගැනීම අඩු මට්ටමකින් පවතින බව නිරීක්ෂණය වේ. ගද්‍ය පාඨයේ උක්තාඛ්‍යාත සම්බන්ධය ගැලපීම, මනඃකල්පිත පරිවර්තන දැක්වීම, ඇතැම් පද මගහැර පරිවර්තනය කර තිබීම වැනි කරුණු දුර්වලතා ලෙස දැකිය හැකිය. ගාථා පරිවර්තනවල අන්වය සකස් කර ගැනීම ද දුර්වල මට්ටමක පැවතුණි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨවලට අර්ථ පාඩම් කිරීම අත්‍යවශ්‍යය. ගුරු භවතුන් විසින් කොටස් වශයෙන් ගද්‍ය පද්‍ය කොටස් සිසුන් ලවා පරිවර්තනය කිරීමේ අභ්‍යාස සිදු කළ යුතු ය. දුර්වලතා හා අඩුපාඩු මගහරවා ගෙන සාර්ථක පරිවර්තනයක් ශිෂ්‍යයෝ ලවා ම සිදු කළ යුතු ය. ශිෂ්‍යයා විසින් ද ගුරු උපදෙස් පිළිපැදීම අත්‍යවශ්‍ය වේ. ශිෂ්‍යයින් සමග සංවාද කරමින් මෙන් ම එක් අයෙකු පාලියෙන් කියූ වාක්‍ය අනෙක් අයෙකු විසින් පරිවර්තනය කිරීම වැනි ක්‍රියාකාරකම් සඳහා යොමු වීම වඩාත් යෝග්‍ය වනු ඇත.

**02. ප්‍රශ්නය**

(i) **පාලියට නගන්න.**

(අ) පින් කරන පුද්ගලයා නිතර නිතර පින් කරයි.

(ආ) ගුණවත් උපාසිකාවෝ විහාරයට ගොස් එකත්පසෙක හුන්නාහ.

(ඉ) ඉදින් ඔබ බුදුන් සිහි කරන්නේ නම් භයක් නො වන්නේ ය.

**(ලකුණු 06යි)**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(අ) පුඤ්ඤං කරොන්තො පුරිසො නිච්චං පුඤ්ඤං කරොති.

(ආ) ගුණවති/ගුණවතියො උපාසිකායො/ උපාසිකා විහාරං ගන්ත්වා එකමන්තං අට්ඨංසු.

(ඉ) අනුස්සරෙථ සම්බුද්ධං භයං තුම්හාකං (තුම්හාක) නො සියා /සචෙ / යදි සම්බුද්ධං අනුස්සරෙථ තුම්හාකං භයං නො සියා

**ලකුණු දීමේ ක්‍රමය**

නිවැරදි එක් පාලි වාක්‍යයකට ලකුණු 2 බැගින් පිරිනමන ලදි. පරිවර්තනයේ එක් දෝෂයක් හෝ ඇත්නම් 1 ලකුණක් අඩු කරන ලදි. වචන මගහැර කරන පරිවර්තනයකට ලකුණු ලබා නොදෙන ලදි.

(ii) පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භූතපුබ්බං භික්ඛවෙ, ඉමිස්සායෙව සාවත්ථියා වෙදෙහිකා නාම ගහපතානී අහොසි. වෙදෙහිකාය භික්ඛවෙ ගහපතානියා එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: සොරතා වෙදෙහිකා ගහපතානි, නිවාතා වෙදෙහිකා ගහපතානි, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. වෙදෙහිකාය ඛො පන භික්ඛවෙ ගහපතානියා කාළී නාම දාසී අහොසි, දක්ඛා අනලසා සුසංවිහිතකම්මන්තා. අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසි: මය්හං ඛො අය්‍යාය එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: සොරතා වෙදෙහිකා ගහපතානී. නිවාතා වෙදෙහිකා ගහපතානි, උපසන්තා වෙදෙහිකා ගහපතානීති, කින්නු ඛො මෙ අය්‍යා සන්තංයෙව නු ඛො අජ්ඣත්තං කොපං න පාතුකරොති? උදාහු අසන්තං? උදාහු මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති? නො අසන්තං? යන්නූනාහං අය්‍යං වීමංසෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ කාළීදාසී දිවා උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානී කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. කිං අයොති? කිං ජෙ දිවා උට්ඨාසීති? 'න ඛො අයෙය කිඤ්චීති.' නො වත රෙ කිඤ්චි පාපී දාසී දිවා උට්ඨාසී'ති කුපිතා අනත්තමනා භාකුටිං අකාසි.

(අ) මේ ඡේදයෙහි දැක්වෙන ස්ත්‍රී චරිත දෙක නම් කරන්න. *(ලකුණු 01 යි)*

(ආ) සිය ස්වාමි දියණිය පිළිබඳ දාසියට ඇති වූ සැකය කුමක් ද? *(ලකුණු 01 යි)*

(ඉ) බුද්ධකාලීන භාරතීය දාසියකගේ ස්වරූපය හෙළි කරන කරුණු දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(ඊ) ජෙ. උදාහු, භාකුටිං, සොරතා යන පදවල අර්ථ දක්වන්න. *(ලකුණු 02 යි)*

**පිළිතුර**

(අ) **වේදේහිකා** ගෘහපතිනිය සහ **කාළි** දාසිය.

(ආ) මාගේ ආර්යාව තමා තුළ ඇත්තා වූ කෝපය පහළ නො කෙරේ ද? එසේත් නැත්නම් නැත්තා වූ ම කෝපය පහළ නො කෙරේ ද? යන සැකය යි.

(ඉ) කටයුතුවල දක්ෂ, කම්මැළි නැති, පිළිවෙළට කටයුතු කරණ

(ඊ) **ජෙ** - බොල, **උදාහු** - නැතහොත්, **භාකුටිං** - බැම හැකිලීම, **සොරතා** - දූමුණු ඉඳුරන් ඇති

**ලකුණු දීමේ ක්‍රමය**

(අ) නිවැරදි එක් නම් කිරීමකට ලකුණු 1/2 බැගින් ලකුණු 1යි.

(ආ) නිවැරදි පිළිතුරට 1 ලකුණ යි.


(ඉ) නිවැරදි එක් කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 2යි.

(ඊ) නිවැරදි එක් අර්ථ දැක්වීමකට ලකුණු 1/2 බැගින් ලකුණු 2යි.

(6 + 6 = 12)

## 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




ප්‍රස්තාරය 3.5(a)


02 ප්‍රශ්නය ද අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයකි. අංක 3.1 ප්‍රස්තාරය අනුව මේ ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 81.51%කි. මෙම ප්‍රශ්නය සඳහා ද ලකුණු 12ක් හිමි වේ. ඉන්

00 - 03 ප්‍රාන්තරයේ 70%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 26%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 3%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 1%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 1%කි. අපේක්ෂකයන්ගෙන් 70%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.

**ප්‍රශ්නයේ කොටස්වල පහසුතාව**




**2 ප්‍රශ්නයෙහි කොටස්**

ප්‍රස්තාරය 3.5(b)

මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත වන අතර (1) කොටස මාධ්‍ය භාෂාවෙන් ඇති වාක්‍ය තුන පාලි භාෂාවට නැඟිය යුතුය. නිවැරදි එක් වාක්‍යකට ලකුණු දෙක බැගින් හිමි වේ. වැරදි 2කට වඩා වැඩි වාක්‍යවලට ලකුණු හිමි නොවේ. සමස්තය සලකා වාක්‍ය 3ටම ලකුණු 3කින් සුදුසු ලකුණක් දීමේ හැකියාවක් තිබේ. (ii) කොටසේ දී ඇති පාලි ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට මාධ්‍ය භාෂාවෙන් පිළිතුරු සැපයිය යුතු ය. එහි අනුකොටස් හතරකි. ඒ ඒ කොටසට පිළිවෙළින් ලකුණු 1, 1, 2, 2 වශයෙන් ලකුණු 6ක් හිමි වේ.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී පළමු කොටසේ (අ) අනුකොටස සඳහා පහසුතාව 31%ක් ද, (ආ) අනුකොටස සඳහා පහසුතාව 25%ක් ද, (ඉ) අනුකොටස සඳහා පහසුතාව 8%ක් ද වේ. දෙවන කොටසේ (අ) අනුකොටසේ පහසුතාව 70%ක් වන අතර (ආ), (ඉ) හා (ඊ) අනුකොටස්වල පහසුතාව පිළිවෙළින් 20%, 16%හා 10%ක් වේ.

මෙම ප්‍රශ්නයේ පළමු කොටසට පිළිතුරු සැපයීමේ දී මාධ්‍ය භාෂාවෙන් පාලි භාෂාවට වාක්‍ය පරිවර්තනය කිරීමේ හැකියාව ලබා තිබිය යුතු ය. මේ සඳහා පාලි භාෂාවතරණය 1 පොතවත් පරිවර්තනය කර තිබීම වැදගත් වනු ඇත. ඒ ඒ විභක්තියට ගැළපෙන අයුරින් පාලි පද ලිවීම සිසුන්ට දුෂ්කර වී තිබේ. නියමානුකූලව විභක්තිය යෙදීමට අපොහොසත්වීම මෙම ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම දුෂ්කර වීමට හේතුව ලෙස දැක්විය හැකිය.

දෙවන කොටසේ අනුකොටස්වලට මාධ්‍ය භාෂාවෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය. (ii), (ඉ), (ඊ) අනුකොටස්වල සාධනය අඩු වීමට හේතුව ලෙස අදාළ වචනවල තේරුම නොදැනීම දැක්විය හැකි අතර අදාළ ඡේදය කියවා අවබෝධ කර ගැනීම සිසුන්ට දුෂ්කර වීම අඩු සාධනයට හේතු වී තිබිය හැකිය.

මේ සඳහා පාලි භාෂාව 5 පොතේ ඇති ගද්‍ය පද්‍ය කොටස් කියවා අර්ථාවබෝධය ලබා ගත යුතු ය. ගුරු භවතුන් විසින් පදානුපදිකව පරිවර්තනය කර සිසුන් ලවා ද පරිවර්තනය කරවිය යුතු ය. එකී පාඨයන්හි ඇති සුවිශේෂී වචනවල අර්ථ ලිවීමට හුරුව ලබා දිය යුතු ය. තවද ගුරුභවතුන් විසින් නිවැරදිව ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පිළිබඳව විධිමත් ලෙස සිසුන් දැනුවත් කළ යුතු අතර පරිවර්තනය හා අභ්‍යාස කරවීම තව දුරටත් නිවැරදි ව අධීක්ෂණය කළ යුතු ය. භාෂාව ප්‍රගුණ කිරීමට ශබ්ද කෝෂ භාවිත කිරීම ද වැදගත් වේ. එමඟින් දුෂ්කර වචනවලට අර්ථ සපයාගත හැකිය.

II කොටස
03 ප්‍රශ්නය

3. (i) වර්ගාක්ෂර පිළිබඳ ඉගැන්වෙන බාලාවතාර සූත්‍ර පාඨය නිවැරදි ව ලියන්න. *(ලකුණු 02)*

(ii) පාලි නාම විභක්ති ප්‍රත්‍යය මාලාව පිළිවෙළින් ලියා දක්වන්න. *(ලකුණු 04)*

(ii) පහත සඳහන් සන්ධිපද විසන්ධි කරන්න. *(ලකුණු 06)*

| | | | |
|---|---|---|---|
| (i) | පාතොව | (ii) | අක්ඛාතං |
| (iii) | පුල්ලිඞ්ගං | (iv) | අවංසිරො |
| (v) | කිංසූධ | (vi) | එතදහොසි |
| (vii) | පරියෙසති | (viii) | ගංගොදය |
| (ix) | උට්ඨාසීති | (x) | පබ්බජිතම්පි |
| (xi) | ධම්මඤ්ච | (xii) | තමරියසඞ්ඝං |

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

I. වග්ගා පඤ්චපඤ්චසො මන්තා

II.

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | සි | යො |
| දුතියා | අං | යො |
| තතියා | නා | හි |
| චතුත්ථී | ස | නං |
| පඤ්චමී | ස්මා | හි |
| ඡට්ඨී | ස | නං |
| සත්තමී | ස්මිං | සු |


III.

| | | | |
|---|---|---|---|
| i. | පාතො + එව | ii. | අ + ඛාතං |
| iii. | පුං + ලිඞ්ගං | iv. | අව + සිරො |
| v. | කිංසු + ඉධ | vi. | එතං + අහොසි |
| vii. | පරි + එසති | viii. | ගංගා + උදය |
| i x. | උට්ඨාසි + ඉති | x. | පබ්බජිතං + අපි |
| xi. | ධම්මං + ච | xii. | තං + අරියසඞ්ඝං |

**ලකුණු දීමේ ක්‍රමය**

i සූත්‍ර පාඨය නිවැරදි ව ලියා ඇත්නම් ලකුණු 2යි.
ii එක් නිවැරදි විභක්ති ප්‍රත්‍යයකට ලකුණු 1/4 බැගින් දී ඉතිරි ලකුණු 1/2 විභක්ති නම් කර තිබීමට ප්‍රදානය කරන ලදි.
iii නිවැරදි විසන්ධි කිරීමකට ලකුණු 1/2 බැගින් ලකුණු 6යි. (2+4+6 = 12)

### 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.6(a)

මෙම ප්‍රශ්නය තෝරා ගැනීමට අවස්ථාව ලබා දී ඇති ප්‍රශ්නයකි. අංක 3.1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 67.1%කි. මේ සඳහා ද ලකුණු 12ක් හිමි වේ. ඉන්

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 04 - 06 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 07 - 09 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 10 - 12 ප්‍රාන්තරයේ 9%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 9%කි. අපේක්ෂකයන්ගෙන් 66%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 6ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.6(b)

මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් තුනකින් යුක්තය. එම කොටස් වලින් වර්ණ මාලා ප්‍රභේද, නාම විභක්ති හා සන්ධි කාණ්ඩය පිළිබඳ අවබෝධය මැන බැලේ.

(i) කොටස සඳහා පහසුතාවය 53%ක් ද, (ii) කොටස සඳහා පහසුතාවය 52%ක් ද, (iii) කොටස සඳහා පහසුතාවය 28%ක් ද වේ. වර්ණ මාලාව පිළිබඳ මූලික ශ්‍රේණියේ සිට අවබෝධයක් ලබා ගන්නා බැවින් (i) කොටස සඳහා ඉහළ සාධන මට්ටමක් ලබා ගැනීමට එය උපකාරී වී ඇත. (ii) කොටසින් විමසා ඇති පාලි නාම වරනැගිල්ල ද පළමු ශ්‍රේණියේ සිට හදාරණ බැවින් හා ඊට අදාළ විභක්ති ප්‍රත්‍ය දෙවන ශ්‍රේණියේ සිට ඉගැන්වෙන බැවින් ශිෂ්‍ය සාධනය ඉහළ මට්ටමක පැවතීමට එය හේතු වී ඇති බව සිතිය හැකිය. පාලි පළමු භාෂාවතරණය භාවිතය මෙවැනි ප්‍රශ්න සඳහා සාධන මට්ටම ඉහළ නංවා ගැනීම උපකාර වන හෙයින් එය හැදෑරීම ද ශිෂ්‍ය සාධනය වර්ධනය සඳහා උචිත ක්‍රමෝපායකි.

(iii) කොටස සඳහා ශිෂ්‍ය සාධනය අඩු මට්ටමක පවතී. ඊට හේතුව වන්නේ සන්ධි පිළිබඳ නිවැරදි වැටහීමක් නොතිබීම විය හැකිය. පෙළ පොතේ සන්ධි පාඩමේ ඇති සන්ධි පද විසන්ධි කිරීමටත් විසන්ධි පද සන්ධි කිරීමටත් සූත්‍ර කටපාඩම් කිරීමටත්, සූත්‍ර පැහැදිලි කිරීමටත්, ශිෂ්‍යයින් උනන්දු කරවිය යුතුය. එකී වචන සහිත නිදසුන් වාක්‍ය ඇසුරින් සන්ධි විසන්ධි කිරීමටත් ශිෂ්‍යයින් පූර්ව සූදානම් කරවිය යුතුය. මේ සඳහා දෘශ්‍යාධාර භාවිතා කිරීම ඉතා වැදගත් ය.

**04. ප්‍රශ්නය**

4. (i) "මදාසරෙ" යන සූත්‍ර පාඨයේ අර්ථය ලියා උදාහරණයක් සපයන්න. *(ලකුණු 02)*

(ii) **තද කළු** අකුරින් මුද්‍රිත නාම පදයන්හි **විභක්තිය** හා **වචනය** ලියන්න. *(ලකුණු 04)*

(i) සො **අක්ඛිණා** කාණො. (ii) **කාමතො** ජායතී සොකො.

(iii) තෙ **විහාරං** පවිසන්ති. (iv) නික්ඛම **සමණ**, පවිස සමණ.

(iii)පහත සඳහන් ක්‍රියා පදවල ආඛ්‍යාත විභක්ති නම් කරන්න. *(ලකුණු 06)*

(i) අභවි (ii) ජගාම

(iii) යාති (iv) පූජෙය්‍යාසි

(v) කරිස්සාම (vi) මොදති

(vii) වන්‍දෙය්‍ය (viii) අගච්ඡා

(ix) දදිංසු (x) භවන්තු

(xi) ජීරති (xii) ආහරිස්සති

**අපේක්ෂිත පිළිතුරු**

I. ස්වරයක් පර කල්හි පූර්වයේ ඇති බින්දුවට 'ම' හා 'ද' ආදේශ වේ.

එතං + අවොච = එතදවොච

එවං + ඉමං = එවමිමං

II.

| විභක්තිය | වචන |
|---|---|
| තතියා විභත්ති | එකවචන |
| පඤ්චමී විභත්ති | එකවචන |
| දුතියා විභත්ති | එකවචන |
| ආලපන විභත්ති | එකවචන |

III. i. අජ්ජතනී ii. පරොක්ඛා

iii. වත්තමානා iv. සත්තමී

v. භවිස්සන්ති vi. වත්තමානා

vii. සත්තමී viii. හීයත්තනී

ix. අජ්ජතනී x. පඤ්චමී

xi. වත්තමානා xii. භවිස්සන්ති

**ලකුණු දීමේ ක්‍රමය**


i නිවැරදි අර්ථ දැක්වීමට හා උදාහරණයට 1 බැගින් ලකුණු 2යි.

ii විභක්ති හා වචන දැක්වීමට ලකුණු 1/2 බැගින් ලකුණු 4යි.

iii එක් නිවැරදි නම් කිරීමකට ලකුණු 1/2 බැගින් ලකුණු 6යි.

**(2 + 4 + 6 = 12)**

## 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.7(a)

මෙම ප්‍රශ්නය ද අපේක්ෂකයන්ගේ අභිමතය පරිදි තෝරා ගැනීමට ඉඩ ලබා දී ඇති ප්‍රශ්නයකි. අංක 3.1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 31.83%කි. මේ සඳහා ද ලකුණු 12ක් හිමි වේ. ඉන්

00 - 03 ප්‍රාන්තරයේ 52%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 24%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 22%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 2%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

4 ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 2%කි. අපේක්ෂකයන්ගෙන් 76%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 6ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.7(b)

මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් තුනකින් යුක්තය. එම කොටස් සන්ධි, විභක්ති, ආඛ්‍යාත යන පාඩම් ඇසුරෙන් සකසා ඇත. (i) කොටස සන්ධි කාණ්ඩය ද (ii) කොටස විභක්ති හා වචන ඇසුරෙන් ද, (iii) ආඛ්‍යාත විභක්ති ඇසුරින් ද සැකසී ඇත.

(i) කොටස සඳහා පහසුතාව 17%ක් ද, (ii) කොටස සඳහා පහසුතාව 37%ක් ද, (iii) කොටස සඳහා පහසුතාව 34%ක් ද වේ. සන්ධි සූත්‍ර පිළිබඳ ව අවබෝධය හා ඊට අදාළ උදාහරණ සිසුන් වන පොත් කර නොතිබීම (i) කොටස සඳහා අඩු ශිෂ්‍ය සාධනයට හේතු වී තිබිය හැකිය. නාම වරනැගිල්ල හා ඒක වචන බහුවචන භේදය පිළිබඳ අවබෝධය නොමැතිකම හා සිසුන් ආඛ්‍යාත විභක්ති හා ඊට අදාළ ප්‍රත්‍ය පිළිබඳ අවබෝධය අවම වීම (ii) හා (iii) කොටස්වල අඩු ශිෂ්‍ය සාධන මට්ටමට බලපා ඇති බව සිතිය හැකිය. අදාළ ආඛ්‍යාත විභක්ති අට උදාහරණ සහිතව ඉගැන්වීම හා අදාළ ආඛ්‍යාත වණ පොත් කිරීමට සිසුන්ට උපදෙස් ලබාදීම වැදගත් වේ.

**05. ප්‍රශ්නය**

5. (i) සර්වනාම ශබ්ද හතරක් ලියා දක්වන්න. *(ලකුණු 02)*

(ii) පහත සඳහන් තද්ධිත පදවල ප්‍රත්‍යය වෙන් කොට ලියන්න. *(ලකුණු 04)*

| | | | |
|---|---|---|---|
| (i) | සබ්බථා | (ii) | සෙට්ඨත්තං |
| (iii) | අට්ඨමො | (iv) | පාපියො |
| (v) | තණ්ඩුලිකො | (vi) | මායාවී |
| (vii) | පච්ඡිමො | (viii) | අභිජ්ඣාලු |

(iii) පහත සඳහන් සමාස පද කුමන සමාසයට අයත් දැයි දක්වන්න. *(ලකුණු 06)*

| | | | |
|---|---|---|---|
| (i) | අනුරථං | (ii) | නිරයො |
| (iii) | මාතාපිතරො | (iv) | ජිනචරිතං |
| (v) | මහාබලං | (vi) | තිලොකං |
| (vii) | තෙවිජ්ජො | (viii) | අත්තනොපදං |
| (ix) | මුඛනාසිකං | (x) | සුභික්ඛං |
| (xi) | ධම්මරතො | (xii) | කාපුරිසො |

**අපේක්ෂිත පිළිතුරු**

I. සබ්බ, කතර, කතම, උභය, ඉතර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම, පුබ්බ, පර, අපර, දක්ඛිණ, උත්තර, එක, ය, ත, එත, ඉම, අමු, කිං, තුම්හ, අම්හ.

II.

| | | | |
|---|---|---|---|
| i. | සබ්බ + ථා | ii. | සෙට්ඨ + ත්ත |
| iii. | අට්ඨ + ම | iv. | පාප + ඉය |
| v. | පච්ඡා + ඉම | vi. | පුරා + තන |
| vii. | මායා + වී | viii. | අභිජ්ඣා + ආලු |

III.


| | | | |
|---|---|---|---|
| i. | අව්‍යයීභාව සමාසය | ii. | බහුබ්බීහි සමාසය |
| iii. | ද්වන්ද සමාසය | iv. | තප්පුරිස සමාසය |
| v. | කම්මධාරය සමාසය | vi. | දිගු සමාසය |
| vii. | බහුබ්බීහි සමාසය | viii. | තප්පුරිස සමාසය |
| ix. | ද්වන්ද සමාසය | x. | අව්‍යයීභාව සමාසය |
| xi. | තප්පුරිස සමාසය | xii. | කම්මධාරය සමාසය |

**ලකුණු දීමේ ක්‍රමය**

i එක් පදයකට ලකුණු 1/2 බැගින් ලකුණු 2යි.
ii නිවැරදි ප්‍රත්‍යය වෙන් කිරීමට ලකුණු 1/2 බැගින් ලකුණු 4යි.
iii නිවැරදි එක් නම් කිරීමකට ලකුණු 1/2 බැගින් ලකුණු 6යි.

**(2 + 4 + 6 = 12)**

## 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.8(a)

5 ප්‍රශ්නය ද අපේක්ෂකයන්ගේ අභිමතය පරිදි තෝරාගෙන පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්නයකි. අංක 3.1 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 20.43%කි. මෙම ප්‍රශ්නය සඳහා ද හිමි ලකුණු ප්‍රමාණය 12කි.

ඉන් 00 - 03 ප්‍රාන්තරයේ 58%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 27%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 14%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 1%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

5 ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 1%කි. ලකුණු 6ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් ප්‍රතිශතය 85%කි.




ප්‍රස්තාරය 3.8(b)

මෙම ප්‍රශ්නය කොටස් තුනකින් යුක්ත වේ. (i) කොටස සර්වනාම වලින් ද, (ii) කොටස තද්ධි වලින් ද (iii) සමාස වලින් ද සකස් වී ඇත. ඒ ඒ කොටස්වලට පිළිවෙළින් ලකුණු 2,4,6, වශයෙන් හිමි වේ.

(i) කොටස සඳහා පහසුතාව 36% ක් ද, (ii) කොටස සඳහා පහසුතාව 16%ක් ද, (iii) කොටස සඳහා පහසුතාව 31%ක් ද වේ. (i), (ii) කොටස්වලට පහසුතාව සාමාන්‍ය මට්ටමක පවතින අතර (ii) කොටසේ පහසුතාව අවම මට්ටමක පවතී. සර්වනාම පිළිබඳ අවබෝධයක් නොමැති හෙයින් (i) කොටසට පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇති බව සිතිය හැකිය. සර්වනාම හා සර්වනාම ශබ්ද වරනැගීම සිසුන් ලවා සිදු කළ යුතුය. (ii) කොටසෙහි සඳහන් ආකාරයේ ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට තද්ධිත කාණ්ඩය පිළිබඳ අවබෝධය ප්‍රත්‍යය සහිත ඒ ඒ තද්ධිත ප්‍රභේදවල දැනුම ලබා දිය යුතු වේ. එම දැනුම නිසියාකාරව නොතිබීම ලකුණු අවම වීමට බලපා ඇත. (iii) කොටසෙහි සමාස කාණ්ඩය පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට ඒවා උදාහරණ සහිත ව සිසුන්ට මතකයේ නොමැති බව පැහැදිලි වේ. එම නිසා සමාස ප්‍රභේද හය හඳුනාගෙන කිනම් සමාසයට එම සමාස උදාහරණය අයත් ද යන්න පරිවේනාචාර්යවරුන් විසින් සිසුන්ට අවබෝධය ලබා දීමට හැකි පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු වේ.

**06 ප්‍රශ්නය**

6. (i) පහත සඳහන් සංඛ්‍යා පාලියෙන් ලියන්න. **(ලකුණු 02)**

(i) 26 (ii) 32 (iii) 99 (iv) 108

(ii) පහත වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න. **(ලකුණු 04)**

(i) චොරො ගොණං චොරෙති.

(ii) දාසො සුනඛං හරති.

(iii) මයං පොත්ථකෙ පඨාම.

(iv) කුමාරා අම්හෙ පහරන්ති.

(iii)පහත දැක්වෙන මාතෘකා අතරින් එකකට වාක්‍ය **හයකට නො** අඩු පාලි රචනාවක් ලියන්න.

*(ලකුණු 06)*

(i) මම මාතා (ii) මහාමහින්දත්ථෙරො (iii) පඨමධම්මදෙසනා

**අපේක්ෂිත පිළිතුරු**

I. i. ඡබ්බීසති ii. ද්වත්තිංසති iii. එකූනසත iv. අට්ඨුත්තරසතං

II. i. චොරෙන ගොණො චොරීයතෙ.

ii. දාසෙන සුනඛො හරීයතෙ.

iii. අම්හෙහි පොත්ථකානි පඨීයන්තෙ.

iv. කුමාරෙහි මයං පහරීයාම.

III. මාතෘකාවට අදාළ ලෙස නිවැරදි වාක්‍ය 6ක් අවම වශයෙන් ලියා තිබිය යුතු ය.


**ලකුණු දීමේ ක්‍රමය**

i නිවැරදි එක් පාලි පදයකට ලකුණු 1/2 බැගින් ලකුණු 2යි.

ii නිවැරදි එක් වාක්‍යයකට ලකුණු 1 බැගින් ලකුණු 4යි.

iii පළමු ක්‍රමය මාතෘකාවට අදාළ ව නිවැරදි ව ලියන ලද එක් වාක්‍යයකට ලකුණු 1 බැගින් ලකුණු 6යි. නොඑසේ නම් සමස්තය සලකා ලකුණු පිරිනමන ලද්දේ සුළු අඩුපාඩු සහිත වාක්‍යවලට උපරිමය ලකුණු 3කි. **(2 + 4 + 6 = 12)**

## 6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.9(a)

මෙම ප්‍රශ්නය ද තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයකි. අංක 3.1 ප්‍රස්තාරය අනුව පිළිතුරු සපයා ඇති අපේක්ෂක සංඛ්‍යාව 28.39%කි. මෙම ප්‍රශ්නයට ද ලකුණු 12ක් හිමි වේ. ඉන්

00 - 03 ප්‍රාන්තරයේ 64%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 20%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 13%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 03%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

6 ප්‍රශ්නය සඳහා ලකුණු 07ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 16%කි. අපේක්ෂකයන්ගෙන් 84%ක්ම ලකුණු 06ක් හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇත.




ප්‍රස්තාරය 3.9(b)

මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් තුනකින් යුක්ත වේ. සංඛ්‍යා පිළිබඳ අවබෝධයත්, කර්ම කාරක පිළිබඳ අවබෝධයත්, වාක්‍ය රචනයක් ලිවීම පිළිබඳ අවබෝධය මැන බැලීමත් සඳහා කොටස් තුන වෙන් කර ඇත.

(i) කොටස සඳහා පහසුතාව 27%ක් ද, (ii) කොටස සඳහා පහසුතාව 10%ක් ද, (iii) කොටසෙහි (i) වන අනුකොටස සඳහා පහසුතාව 25%ක් ද, (ii) කොටස සඳහා 25%ක් ද (iii) කොටස සඳහා 19%ක් ද වේ. මෙම කොටස් තුනෙහිම ශිෂ්‍ය සාධනය ඉතා අවම මට්ටමක පවතියි. සෑම වර්ෂයකම මෙම ප්‍රශ්නය ඇතුළත් වන බැවින් සංඛ්‍යා කටපාඩම් ගැනීමටත්, වාක්‍ය කර්මකාරකයට හැරවීම සඳහා අභ්‍යාස ලබා දීමටත් වාක්‍යයක් කර්මකාරකයට හරවා ගැනීමේ දී සිදුවන ව්‍යාකරණ රීති සිසුන්ට අවබෝධ කරවීමටත් කටයුතු කළ යුතු ය.

සරල වාක්‍ය නිර්මාණය හා මාතෘකාවලට රචනා ලියවීම බාහිර ක්‍රියාකාරකම් ලෙස සිදු කිරීමත්, උදෑසන රැස්වීම හා ශිෂ්‍ය සමිතිය තුළින් මෙම විෂය නිපුණතාව වඩාත් සංවර්ධනය කර ගැනීමටත් අවස්ථාව ලබා දිය හැකිය.

**07 ප්‍රශ්නය**

7. (i) පහත දැක්වෙන වචන පාලි භාෂාවෙන් ලියන්න. **(ලකුණු 02)**

(i) වහා (ii) හෙමින්

(iii) ඉහළ (iv) පහළ

(ii) පහත සඳහන් පදවල උපසර්ග පද වෙන් කර ලියන්න. **(ලකුණු 04)**

(i) ආහරති (ii) සංහරති

(iii) පරිහරති (iv) නීහරති

(iii) පහත දැක්වෙන නිපාත පද සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවා වාක්‍ය නැවත ලියන්න.
**(ලකුණු 06)**

(සයං, කිඤ්චි, අතිප්පගො, අඤ්ඤදත්‍ථු, තුණ්හී, ස්වාගතං)

(i) එතු ඛො භන්තෙ, භගවා ........................ භන්තෙ.

(ii) එවං වුත්තෙ ආයස්මා සඞ්ගාමජී ............................ අහොසි.

(iii) දිට්ඨෙව ධම්මෙ ............................ අභිඤ්ඤා සච්ඡිකත්‍වා උපසම්පජ්ජ විහරති.

(iv) ............................ අක්කොසමෙව අලත්‍ථ.

(v) යං ............................ සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති.

(vi) ............................ ඛො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුං.

**අපේක්ෂිත පිළිතුරු**

7. I. වහා - ලහුං, ඛිප්පං, සීඝං, ආසු, තුරිතං, තුරිතතුරිතං

හෙමින් - සනිකං

ඉහළ - උද්ධං

පහළ - අධො

II. i. ආහරති - ආ

ii. සංහරති - සං

iii. පරිහරති - පරි

iv. නීහරති - නී

III. (i) එතු ඛො භන්තෙ, භගවා **ස්වාගතං** භන්තෙ.

(ii) එවං වුත්තෙ ආයස්මා සඞ්ගාමජී **තුණ්හී** අහොසි.

(iii) දිට්ඨෙව ධම්මෙ **සයං** අභිඤ්ඤා සච්ඡිකත්‍වා උපසම්පජ්ජ විහරති.

(iv) **අඤ්ඤදත්‍ථු** අක්කොසමෙව අලත්‍ථ.

(v) යං **කිඤ්චි** සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති.

(vi) **අතිප්පගො** ඛො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුං.


**ලකුණු දීමේ ක්‍රමය**

i නිවැරදි එක් වචනයකට ලකුණු 1/2 බැගින් ලකුණු 2යි.
ii නිවැරදි පද වෙන් කිරීමට ලකුණු 1 බැගින් ලකුණු 4යි.
iii නිවැරදි හිස්තැන් පිරවීමට ලකුණු 1 බැගින් ලකුණු 6යි.

**(2 + 4 + 6 = 12)**

## 7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**07 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




ප්‍රස්තාරය 3.10(a)


මෙම ප්‍රශ්නය ද තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයක් වන අතර අංක 3.1 ප්‍රස්තාරය අනුව පිළිතුරු සැපයීමට මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 68.82%කි. මෙම ප්‍රශ්නයට ද ලකුණු 12ක් හිමි වේ. ඉන්

00 - 03 ප්‍රාන්තරයේ 28%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 33%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 26%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 13%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

07 ප්‍රශ්නය සඳහා ලකුණු 03ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 28%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 39%ක් ලකුණු 7ක් හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇත.

**ප්‍රශ්නයේ කොටස්වල පහසුතාව**




ප්‍රස්තාරය 3.10(b)

මෙම ප්‍රශ්නය ද (i), (ii), (iii) වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විතය. නිපාත පද, උපසර්ග හා හිස්තැන් පිරවීම යන විෂය කරුණු මෙමගින් මැන බැලේ. මෙම කොටස්වලට පිළිවෙළින් 2, 4, 6 වශයෙන් ලකුණු 12ක් පිරිනැමේ.

(i) කොටසෙහි පහසුතාව 31%ක් ද (ii) කොටසෙහි පහසුතාව 65%ක් ද (iii) කොටසෙහි පහසුතාව 38%ක් ද වේ. (i) හා (iii)කොටස් සඳහා ශිෂ්‍ය සාධනය අවම මට්ටමක පවතින අතර (ii) කොටස සඳහා ශිෂ්‍ය සාධනය ඉතා ඉහළ මට්ටමක පවතී. නිපාත පදවල සිංහල අර්ථ මතක තබා ගැනීම සඳහා සිසුන් උනන්දු කළ යුතු අතර පාඩම් ගැනීමේ දී ගුරුවරයා විසින් නිපාත පදවල අර්ථය විමසිය යුතු ය.

(ii) කොටස සඳහා ශිෂ්‍ය සාධනය ඉතා ඉහළ මට්ටමක පැවතීමට උපසර්ග පිළිබඳ අවබෝධය අපේක්ෂකයන් තුළ පැවතීම හේතු වී තිබිය හැකිය. තවදුරටත් ක්‍රියාපදවල උපසර්ග වෙන්කිරීම සඳහා අභ්‍යාස ලබා දී නිවැරදි අවබෝධය ලබා දිය යුතුය. (iii) කොටසෙහි හිස්තැන් සඳහා සුදුසු නිපාත පද නිවැරදිව යෙදීමට අපේක්ෂකයන් අපොහොසත් වී ඇත. ත්‍රිපිටකය කියවන විට මෙවැනි විශේෂ වාක්‍ය ගෙන නිපාත යෙදී ඇති තැන් සිසුන්ට පෙන්වා අවබෝධය ලබා දිය යුතු ය.

**08 ප්‍රශ්නය**

8. (i) අපදානපාළියේ ඇතුළත් අපදාන සංඛ්‍යාව හා ගාථා ගණන ලියා දක්වන්න. *(ලකුණු 04)*

(ii) දිඹුලාගල කාශ්‍යප මාහිමියන්ගෙන් පාලි සාහිත්‍යයට සිදු වූ සේවාව අගයන්න. *(ලකුණු 04)*

(iii)නන්ද සූත්‍රයේ සාරාංශය ලියා දක්වන්න. *(ලකුණු 04)*

**අපේක්ෂිත පිළිතුරු**

8. I. අපදාන ගණන - 592

ගාථා ගණන - 7619

II. ⋆ ග්‍රන්ථ සම්පාදනය - අභිධම්මපුරාණටීකාව

බාලාවබෝධනය

මෝහවිච්ඡේදනී

අනාගතවංස ආදි ග්‍රන්ථ රචනා කිරීම.

⋆ මහාපරාක්‍රම බාහු රජුගේ අනුග්‍රහයෙන් සඟ සසුන පිරිසිදු කිරීම.

⋆ තෙළෙස් ධූතංගධර වූ උන්වහන්සේ **මහාථෙර, සංඝපරිනායක** ආදි නම්වලින් ද හඳුන්වා ඇති බව.

⋆ උන්වහන්සේගේ විනය විශාරදභාවය, සුපේශල ශික්ෂාකාමිත්වය.

⋆ විශිෂ්ට ශිෂ්‍ය පරපුරක් බිහි කිරීම.

වැනි කරුණු කීපයක් පිළිතුර තුළ විස්තර වී තිබිය යුතු ය.

III. භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි නන්ද තෙරුන් බොහෝ භික්ෂූන්ට තමා සිවුරු හැර යන බව ප්‍රකාශ කළේය. එක්තරා භික්ෂුවක් මේ පුවත බුදුරදුන්ට සැළ කළේය. බුදුරදහු නන්ද තෙරුන් කැඳවා අකමැත්තෙන් බඹසර හැසිරෙන්නේ දැයි විමසූහ. එවිට තමාට වහා එන්නැයි ජනපද කල්‍යාණිය පැවසූ වදන් සිහිවන බව නන්ද තෙර බුදුන්ට කීය. ඉක්බිති බුදුහු නන්ද තෙරුන්ගේ අතින් අල්ලාගෙන දෙව්ලොවට ගොස් රන්වන් පැහැති අප්සරාවන් පන්සියයක් පෙන්වූහ. නන්ද තෙරුන් බුදුන් වහන්සේගෙන් අප්සරාවන් ලබා ගැනීමේ පොරොන්දුව මත බඹසර විසීමට එකඟවිය. ඉක්බිති ව බඹසර වැස රහත් වූහ.

**ලකුණු දීමේ ක්‍රමය**


i නිවැරදි එක් පිළිතුරකට ලකුණු 2 බැගින් පිළිතුරට ලකුණු 4යි.

ii ග්‍රන්ථ සම්පාදනය, ශාසන පාරිශුද්ධිය, පුද්ගලික දක්ෂතා හා ශාසනික සේවාව යන එක් ක්ෂේත්‍රයකට 1 ලකුණ බැගින් ලකුණු 4යි.

iii නිවැරදි සාරාංශයට ලකුණු 4යි. ඌනතා ඇත්නම් සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

**(4 + 4 + 4 = 12)**

## 8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.11(a)

මෙම ප්‍රශ්නය ද තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයක් වන අතර අංක 3.1 ප්‍රස්තාරය අනුව පිළිතුරු සපයා ඇති අපේක්ෂක සංඛ්‍යාව 40%කි.
මෙම ප්‍රශ්නයට ද ලකුණු 12ක් හිමි වේ. ඉන්

00 - 03 ප්‍රාන්තරයේ 30%ක් ද,
04 - 06 ප්‍රාන්තරයේ 34%ක් ද,
07 - 09 ප්‍රාන්තරයේ 27%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 9%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

08 ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 9%කි.
අපේක්ෂකයන් අතුරෙන් 64%ක් ලකුණු 6ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත.





ප්‍රස්තාරය 3.11(b)

මෙම ප්‍රශ්නයේ ද කොටස් තුනක් ඇති අතර පාලි සාහිත්‍ය හා සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ අවධානය යොමු කර ඇත. මේ සඳහා එක කොටසකට ලකුණු 04 බැගින් කොටස් 03ට ලකුණු 12ක් හිමිවේ.

(i) කොටස සඳහා පහසුතාව 45%ක් ද, (ii) කොටස සඳහා පහසුතාව 31%ක් ද, (iii) කොටස සඳහා පහසුතාව 56%ක් ද වේ. සිසුන්ට වැඩි වශයෙන් සාර්ථකව පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්නයක් ලෙස දැක්විය හැකිය. මෙහි (iii) කොටසෙහි සාධනය ඉහළ මට්ටමක පවතී. (i), (ii) ප්‍රශ්නවල සාධනය සාමාන්‍ය මට්ටමක පවතී. උදාන හා අපදාන සාහිත්‍ය මූලාශ්‍ර පිළිබඳ ව අවබෝධය ලබා ගැනීමට සිසුන් උනන්දු කළ යුතු අතර පාලි සාහිත්‍ය ග්‍රන්ථ කතුවරුන්ගෙන් සිදු වූ සේවාව පිළිබඳ ව සිසුන්ට දැනුම ලබා දිය හැක්කේ නම් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වනු ඇත.

## 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන.




ප්‍රස්තාරය 3.12

(1) හා (2) ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වුවද 01 ප්‍රශ්නයට අපේක්ෂකයන් 85.59%ක් පමණක් පිළිතුරු සපයා ඇත. එම ප්‍රශ්නයේ පහසුතාව 35%කි. 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන් ප්‍රතිශතය 81.51%ක් වන අතර එහි පහසුතාව 94%කි. අඩුම අපේක්ෂකයන් පිරිසක් එනම් 20.43%ක් තෝරාගෙන ඇත්තේ 05 ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 27%කි. 05 ප්‍රශ්නයට අමතරව තෝරා ගැනීම අඩුම ප්‍රශ්නය 06 ප්‍රශ්නයයි. එය 28.39%ක අපේක්ෂකයන් පිරිසක් තෝරා ගෙන ඇති නමුත් II ප්‍රශ්න පත්‍රයෙහි පහසුතාවෙන් අඩුම ප්‍රශ්නය එය වේ.

සර්වනාම, තද්ධිත සමාස පිළිබඳ ව දැනුම 05 ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇති අතර 06 වනප්‍රශ්නයෙන් සංඛ්‍යා පිළිබඳ අවබෝධය, කර්මකාරක පිළිබඳ අවබෝධය හා වාක්‍ය රචනාව පිළිබඳ අවබෝධය පරීක්ෂා කර ඇත. මෙම කොටස සඳහා සිසුන්ගේ අවබෝධය වැඩි කිරීමට පෙළ පොත පරිශීලනය, පසුගිය ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීමේ හුරුව ලබාදීම මෙන්ම මතකයේ තබාගත යුතු කරුණු ක්‍රියාකාරකම් පාදක කොටගෙන පුනරීක්ෂණ කිරීම කළ යුතු ය.

ප්‍රශ්න අංක 7 හා සැසඳීමේදී අංක 3, 4, 5, 6 හා 8 යන ප්‍රශ්න පහේම පහසුතාව අඩු බව පැහැදිලි වේ. ප්‍රශ්න තෝරා ගැනීමේ දී අපේක්ෂකයන් බහුතරයක් එනම් 68.82%ක් පහසුතාව වැඩිම ප්‍රශ්නය තෝරා ගෙන ඇත. 7 ප්‍රශ්නයෙහි පහසුතාව 47%කි. නිපාත හා උපසර්ග පිළිබඳ අවබෝධය පරීක්ෂා කර ඇති මෙම ප්‍රශ්නය අපේක්ෂකයන් බහුතරයක් තෝරා ගැනීමට හේතුව ලෙස නිපාත වල අර්ථ ලිවීම, ක්‍රියාපදවලින් උපසර්ග වෙන් කිරීම, වාක්‍යවල හිස්තැනට සුදුසු නිපාත පද යෙදීම ලෙස ප්‍රශ්න කොටස් තුනෙහිම පිළිතුරු සැපයීමට ඇති පහසුව නිසා මෙම ප්‍රශ්නය අපේක්ෂකයන් බහුතරයක් තෝරාගෙන ඇති බව සිතිය හැකිය.

ලබා දී ඇති අමතර කාලය ප්‍රශ්න පත්‍රය නිවැරදි ව කියවා අවබෝධ කර ගෙන පහසු ප්‍රශ්න තෝරා ගැනීමට සුදුසු පරිදි යොදවා ඇති බවත් නිරීක්ෂණය වේ.

සමස්ත II ප්‍රශ්න පත්‍රය කෙරෙහි අවධානය යොමු කිරීමේදී ප්‍රශ්න 8න් දෙවැනි ප්‍රශ්නයෙහි පමණක් පහසුතාව 50%ක් ඉක්මවා ඇත. සෙසු ප්‍රශ්න 7ම පහසුතාව 47%ක් හෝ ඊට අඩු අගයකි.

## 4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු

**පොදු උපදෙස්**

* ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතු ය. අනිවාර්ය ප්‍රශ්න හා තෝරාගත් ප්‍රශ්න වශයෙන් ද කොටස් හා අනුකොටස් වශයෙන් ද ප්‍රශ්න පත්‍රයට ගත වන කාලය පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.

* I පත්‍රයට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගෙන පැහැදිලි එක් කතිර ලකුණක් (X) පමණක් යෙදිය යුතු ය.

* II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී තෝරා ගන්නා ප්‍රශ්න අතරින් පහසු ප්‍රශ්න තෝරා ගත යුතු ය.

* II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

* ප්‍රශ්න කොටස් හා අනුකොටස් පිළිවෙළට යෙදිය යුතු ය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් සැපයිය යුතු ය.

* සෑම පිටුවකම අපේක්ෂකයාගේ විභාග අංකය හා පිටු අංකය යෙදිය යුතු ය.

* කෙටි පිළිතුරු කෙටි වශයෙන් ද දීර්ඝ පිළිතුරු දීර්ඝ වශයෙන් ද ලිවිය යුතු ය.

* පිළිතුරු සැපයීමේ දී එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරාගත යුතු ය.

* පිළිතුරුපත් ඇමිණීමේ දී පිටු අංක පිළිවෙළට ඇමිණිය යුතු ය.

* මුල් පිටුවේ විභාග අංකය විෂය හා පත්‍රය ආදී සඳහන් කළ යුතු විස්තර අනිවාර්යයෙන් ම ඇතුළත් කළ යුතු ය.

* II පත්‍රයේ ප්‍රශ්නවලින් නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට පමණක් පිළිතුරු සැපයීමට කාලය මිඩංගු කළ යුතු අතර, වැඩිපුර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට කාලය වැය නොකළ යුතු ය.

## 5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

* අත් අකුරු නිවැරදි ව හා නිරවුල් ව ලිවීමට ශිෂ්‍යයා යොමු කළ යුතු ය. අත් අකුරු ලිවීමේ අභ්‍යාසවල ශිෂ්‍යයා යෙදවිය යුතු ය.

* අක්ෂර හා අක්ෂර ප්‍රභේද, උත්පත්තිස්ථාන ආදිය විග්‍රහ වාක්‍ය ඇසුරින් ඉගැන්වීම කළ යුතු ය. පාඨ වාචෝද්ගත කළ යුතු ය. පාඨවල අදහස මාධ්‍ය භාෂාවෙන් ලිවිය යුතු ය.

* නිර්දිෂ්ට සූත්‍ර හා ගාථාවලට අර්ථ ලිවීමට අර්ථ පාඩම් කරවිය යුතු ය. තෝරාගත් ඡේදවලට හා ගාථාවලට අර්ථ ලියවා නිවැරදි කරවිය යුතු ය. නිර්දිෂ්ඨ පාඨ හා ගාථාවල අර්ථ පැහැදිලි කර දිය යුතු ය.

* ගාථාවලට අර්ථ සැපයීමේ දී අන්වය සකසා ගන්නා ආකාරය පෙන්වා දිය යුතු ය.

* නියමිත පාලි පාඨ ග්‍රන්ථයේ ඇති ඡේද හා ගාථා අර්ථ ගන්වා තේරුම් කර දිය යුතු ය. ඒ ඇසුරින් ප්‍රශ්න සකසා ඒවාට පිළිතුරු සැපයීමට සිසුන් යොමු කළ යුතු ය.

* ප්‍රශ්න පත්‍රයේ ඇති නිවැරදි නොවන පිළිතුරුවලට ගැලපෙන ප්‍රශ්න සිසුන් ලවා සකස් කරවීම මගින් ස්මරණය වැඩි කර ගැනීමට අවකාශ ලබාදිය යුතු ය.

* සරල මාතෘකා කිහිපයකට රචනා ලියවා එසේ රචනා ලිවීමට සිසුන් යොමු කළ යුතු ය.

* ප්‍රශ්න පත්‍රයේ ස්වරූපය පැහැදිලි කර දී පහසු ප්‍රශ්න තෝරා ගන්නා ආකාරය පෙන්වා දිය යුතු ය. අනිවාර්ය ප්‍රශ්න මග හැරිය යුතු නොවන බව අවධාරණය කළ යුතු ය.

* ලේඛන දුර්වලතා මගහරවා ගැනීමට සතතාභ්‍යාසයේ යෙදිය යුතු ය.

* ව්‍යාකරණ, ඉගැන්වීමේ දී සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා නූතන ව්‍යවහාර ක්‍රමයක් සකසා ගත යුතු ය.

* ව්‍යාකරණ හුදකලාව නූගන්වා ව්‍යවහාරයේ වාක්‍යවල එන ව්‍යාකරණ තුළින් ව්‍යාකරණ ඉගැන්විය යුතු ය.

* විටින් විට ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලියවා ශිෂ්‍යයා අභිප්‍රේරණය කළ යුතු ය.

* කටපාඩම් කරගත යුතු දේ වෙන් කොට ලබා දී ටිකෙන් ටික පාඩම් ගත යුතු ය.

* නිර්දිෂ්ට ග්‍රන්ථ හා කතුවරු පිළිබඳ තොරතුරු එක්රැස් කරවිය යුතු ය.

* නිපාත පද, උපසර්ග ආදී ව්‍යාකරණ කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

* ප්‍රතිඵල විශ්ලේෂණ වාර්තා සසඳා බලා සිසුන්ගේ දුර්වල අවස්ථා මොනවා දැයි තේරුම් ගෙන කටයුතු කළ යුතු ය.

* පාලි සංඛ්‍යා කෙරෙහි අවධානය යොමු කරවිය යුතු ය.

* පාලි භාෂාවේ දෛනික ව්‍යවහාර ඇසුරින් සංවාදයේ යෙදිය යුතු ය.

* ව්‍යාකරණ ඉගැන්වීමේ දී බාලාවතාරය කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

* මාසික පරීක්ෂණ නිසි පරිදි සිසුන් ලවා ලියවා එම ප්‍රශ්න සාකච්ඡා කිරීම කළ යුතු ය.

* සෑම පාඩමක් අවසානයේදී ම විභාගය ආශ්‍රිත ප්‍රශ්න සඳහා පිළිතුරු ලියවා එම පිළිතුරු සකස් විය යුතු ආකාරය සාකච්ඡා කළ යුතු ය.

* ව්‍යාකරණ කාණ්ඩ අට 3 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා බෙදා දී ඒවා අවබෝධ කරවීමට හා ස්මරණය කළ හැකි ආකාරයට ක්‍රියාකාරකම් පාදකව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතු ය.

* වර්ෂ කිහිපයක ප්‍රතිඵල විශ්ලේෂණ වාර්තා හා ඇගයීම් වාර්තා සසඳා බලා අපේක්ෂකයන් වැඩි වශයෙන් දුර්වල සාධන මට්ටමක් පෙන්නුම් කර ඇති විෂය කොටස් සඳහා සාධනය ඉහළ නංවා ගත හැකි ආකාරයේ ක්‍රියාකාරකම් හා අභ්‍යාසවල නිරන්තරයෙන් සිසුන් නිරත කරවීමට කටයුතු කළ යුතු ය.

Printed by
Department of Examinations Press